චන්ද්‍රශේඛර *s.* (චන්ද්‍ර and ශේඛර *a crest*) one of the names of *siva*, alluding to his being sometimes represented with a half moon on his fore head

චපල *a.* trembling, tremulous, shaking, wavering; unruly; criminal; swift, expeditious

චපල· *a.* momentary, instantaneous; agitated violently; overcome with alarm

චපලඃ *s.* quicksilver; a kind of stone; a fish; a thief

චපලදුම *s.* the screw pine (*pandanus odoratissimus*)

චපලා *s.* *lakshmi* the goddess of luck or fortune; lightning; a whore; long pepper; the tongue

චපලෙලා plur. of චපලා

චමර *s.* a kind of deer, or more properly the *bos grunniens*

චමූ or චමු *s.* an army, a squadron or division of an army

චමූරු see චමර

චම්පා or චම්පා *s.* the capital of *carna* and the modern *bhaghalpore*

චම්පක *s.* a tree bearing a yellow fragrant flower, with which the altars in the temples of *buddha* are covered every morning (*michelia champaca*); also, a division in the jack fruit

චය *s.* an assemblage, a multitude; a heap, a collection; a rampart, a mound of earth raised from the ditch of a fort; the gate of a fort; a cover, a covering

ඡායාව *s.* shade, shadow

චර *s.* a spy, a secret emissary or agent; the planet *mars;* a game, similar to back-gammon; a wag-tail

චරක *s.* a spy or secret emissary; also the name of a treatise upon medicine, as well also the name of the author

චරති *v.* he goes, he walks, he journeys

චරණය *s.* a foot; the root of a tree; a race or family; a fixed or instituted observance; the peculiarity of condition or conduct implied by the english *hood;* as, man-hood, priest-hood;—*part. a.* wandering, roaming, going about

චරණනඛ *s.* a toe nail

චරණායුධලය *s.* a biped

චරණායුධ *s.* (චරණ *a foot* ආයුධ *a weapon*) who fights with his foot, a cock

චරිකා *s.* a spy, a secret emissary; a guide

චරය see චර

චරාචර *part. a.* moving, locomotive; shaking, trembling

චරි *s.* an animal, an animal in general

චරිත *s.* a fixed institute, a proper or peculiar observance; a mode, a manner, a condition

චරිත්‍ර *s.* an instituted and peculiar observance or conduct; an observance, a custom, a mode

චරිෂ්ණු *a.* moveable, locomotive

චරිත්‍රාඥ see the foregoing word
චලි s. a young woman ;-a. trembling, shaking, unsteady; locomotive, moveable'
චරු s. an oblation of milk and butter, with fire to the gods or manes; also the vessel in which an oblation is prepared
චරුම s. the skin, hide
චර්චරී s. festive sport; a kind of song; striking the hands to beat time
චර්ම s. skin; bark; the hide; a shield; a hide, used by *hindu* students and ascetics as their seat and bed, usually the skin of a tiger or antelope
චර්මකාර s. (චර්ම *skin* කාර *who does or makes*) a worker in leather, a currier; a shoemaker
චර්මගුය s. the fore skin
චර්මඝාත s. a leather cutter; shoemaker?
චර්මපත්‍රා s. (චර්ම *skin* පත්‍ර *a wing*) a bat, the small house-bat
චර්මප්‍රසේවිකා s. a bellows
චර්මය see චර්ම
චර්මින් s. a shield bearer, a soldier armed with a shield
චය්‍යීය s. a due and regular observance of all religious *rites* and *ceremonies;* perseverance in the practice of religious austerities
චය්‍යීව see the foregoing
චල a. trembling, shaking, tremulous, unsteady, unfixed, rolling, moving, moveable
චලන a. wandering, roaming; trembling, shaking; spearing, piercing
චලනා s. a foot; a deer; an antelope; a woman
චලප්‍රාණ s. the wind
චලාචල a. tremulous, unsteady, unfixed—s. a crow
චලිත part. a. shaking, trembling —part. gone, departed
චවන s. death
චවමාන past. part. dead
චවිකා s. the long pepper plant
චවිය s. the skin; the upper skin
චව්‍ය s. the long pepper plant
චය s. a multitude, an assembly; a heap, a collection
චෂක s. a vessel for drinking spirits with, a wine glass; any drinking vessel
චාග s. a donation, a gift; a state of destitution
චාගධන s. things which have been given, presents
චාට s. a cheat, a rogue, a peculator, one who makes away with money &c. which has been entrusted to him
චාටු a. cheating, deceiving, misleading—s. pleasing or grateful discourse
චාඬාල s. the name of an impure or degraded tribe; a kind of an outcast or *pariah* see චඬාල and its compounds
චාඬාලිකා s. one of the names of *durga*, alluding to her mischievous and irascible temper; also, a kind of vulgar lute
චාතක s. a kind of bird usually called කැදැත්තා which see
චාතපඤ්ඤයා see කැදැත්තා;
චාන්ද්‍රදිසි s. the new moon
චාතුර්මහාරාජිකාය s. the visible heavens, firmament
චාන්ද්‍ර s. the planet *Mercury,* (thursday)
චාමර s, a sort of large fan, made from the root of a fragrant grass, and used to fan kings or great men; a kind of whisk or brush made from the tail of the indian *yac* (*bos grunniens*) and used to whisk off the flies &c.

චාමරපුෂ්ප *s.* the betel nut tree; the mango tree; a sort of grass (*saccharum cylindricum*); also, a kind of flower (*pandamus odoratissimus*)

චාමරවාලධිය *s.* the tail of the *indian yac*, or the *bos grunniens*

චාමෙර see චාමර

චාමීකර *s.* gold, variety of gold

චාම්පෙය *s.* the champac tree, see චම්පක; another kind of tree (*mesua ferrea*)

චායාව see ඡායා

චාර *s.* going, motion; a spy, a secret agent or emissary; a fetter; a prison; a kind of tree (*buchannania latifolia*); wandering about, travelling

චාරක *s.* a groom, a horseman, a cavalier; a binding, a fetter; an associate a companion

චාරචාරකම *s.* courtesy, civility, politeness

චාරිකාව *s.* a wandering, a going about, a moving, travelling

චාරිත්‍රය *s.* a practice, an observance; a custom, a peculiarity of custom or condition, a fit or proper action

චාරු *s.* a name of *brahaspati* regent of *Jupiter*, and *preceptor* of the gods; a prepared oblation for the gods; gold; —*a.* beautiful, pleasing, delightful

චාරූ• see the foregoing word

චාරුද්‍රැ *s.* the nuga tree (*ficus religiosa*)

චාරුදර්ශන *s.* (චාරු *beautiful* දර්ශන *sight*) any beautiful object or pleasing sight; also, the name of a plant පුලලගහ or පුලොලගහ also, a tree *long pepper*;

චාරුදූසක *s.* a kind of tree (*buchannania latifolia*)

චාරුනාදිත්තා *s.* red arsenic

චාරුඵලා or චාරුඵලා *s.* (චාරු *beautiful* ඵල *fruit*) the grape; also, the name of a tree (*bignonia grandis*)

චාරුපුෂ්ප *s.* the trumpet flower

චාරුමුෂ්කක *s.* a kind of tree the bark of which is medicinal, (*swietenia febrifugia*)

චාරුකීක *s.* blue vitriol; sulphate of copper, especially considered as medicinal; also a collyrium extracted from the *amomum zanthorhiza*

චාරුලෝචනා *s.* (චාරු *beautiful* ලෝචනා *eye*) a deer; an epithet for a woman, considered as the highest mark of beauty

චාරුශිලා *s.* (චාරු *and* ශිලා *a stone*) a gem, any precious stqne

චාර්වාක *s.* (චාරු *beautiful* වාක *discourse*) one who enchants or deludes by his beautiful or enticing speeches; a kind of sceptic in matters of religion; a sophist, a philosopher

චාලනා or චාලිනී *s.* a sieve, a strainer

චාලිත්‍ය see චාරිත්‍රය

චිංචා *s.* the tamarind; —*a.* sour, acid

චිකිත්සක *s.* a physician, a practitioner in medicine

චිකිත්සාව *s.* the practice of medicine, healing, curing, administering or applying remedies

චිකිලි *s.* mud, mire

චිකුර *s.* hair; a mountain; a snake; a musk rat; a kind of bird

චිකුරු *a.* rashly criminal, inconsiderately guilty; punishing or injuring others without consideration

චිඤ්ච. s. the tamarind tree

චිටිචිටා s. a sound, a sharp or shrill noise; also, a sound like the dropping of water

චිමිචිමා see චිටිචිටා

චිත් s. intellect, understanding; a collection, a multitude, a heap

චිත a. covered, veiled, concealed, closed, pressed together

චිතාඞ්ගුලිතා s. the fingers so closely pressed together, that no opening is seen, one of the beauties of *buddha's* hand

චිති s. a funeral pile; a heap, a quantity

චිත්ත s. the mind or faculty of reasoning, the heart, considered as the seat of intellect; thought, conception

චිත්තා s. one of the lunar constellations; also, a star in the virgin's spike

චිත්තාභෝගය s. consciousness, perception, sensibility

චිත්‍ය s. memento, a monument, a remembrancer, any mark of the scite of a funeral pile

චිත්‍ර s. wonder, surprise; a painting; delineation, writing &c. sky, heaven; a circular ornament; a sectarial mark on the forehead of a *hindu*; white or spotted leprosy

චිත්‍රං or චිත්‍රඃ s. variegated colour:—*a.* variegated, spotted; speckled; wonderful, surprising; one of the names of *yama* the *indian pluto*

චිත්‍රක s. a mark made with sandal &c. on the forehead of a hindu to distinguish the religious sect to which he belongs

චිත්‍රකඃ s. a *cheeta* or small hunting leopard; a painter; the castor oil plant; a medicinal plant (*plumbago zeylanica*)

චිත්‍රකශිකා s. (චිත්‍ර *ornamented* කශිකා *speech*) a highly finished speech

චිත්‍රකාම්බොජ s. a tree (*dalbergia ougeiniensis*)

චිත්‍රකාය s. (චිත්‍ර *spotted* කාය *body*) the tiger

චිත්‍රකාරයා s. (චිත්‍ර *a painting* කාර *who does*) a painter

චිත්‍රකූටය s. (චිත්‍ර *wonderful* කූට *a peak*) the name of a mountain in *bundelcund*, the modern *comptch*, and first habitation of *ráma* in his exile

චිත්‍රගුප්ත s. (චිත්‍ර *writing* ගුප්ත *preserving*) one of the names of *yama*, alluding to his office as regent of the dead and the judge of their actions; *yama's* registrar, who records the vices and virtues of mankind

චිත්‍රතණ්ඩුල s. a medicinal plant said to possess *anthelmintic* virtues

චිත්‍රඵලා s. a kind of plant (*trichosanthes anguina*)

චිත්‍රපර්ණිකා s. a plant (*hemionites cordifolia*); bengal madder (*rubia manjith*)

චිත්‍රපාටලි s. the trumpet flower (*bignonia chelonoides*)

චිත්‍රඵලම් s. see චිත්‍රඵලා; also, a kind of cucumber

චිත්‍රභානු s. (චිත්‍ර *surprising* භානු *light*) fire; the sun; one of the names of *bhairava* a form of *siva*

චිත්‍රරථය s. (චිත්‍ර *painted* රථ *a car*) the lord of the painted car, the sun in allusion to the ornamented car of *indra* the regent of the sun

චිත්‍රලතා s. the garden of *indra*

චිත්‍රවල්ලිකා s. a sheat fish (*silurus pelorius*)

චිත්‍රශිඛණ්ඩජ *s.* one of the names of *brahaspati* or the regent of the planet *Jupiter*

චිත්‍රශිඛණ්ඩීන් *s.* the seven sages so much celebrated in hindu history, but especially as represented in the seven principal stars of the great bear

චිත්‍රාංගනා *s,* (චිත්‍ර *spotted* අංග *body*) a kind of snake: a plant (*plumbago zeylanica*;) yellow orpiment, vermillion; one of the names of *subhadra* the sister of *jaganátha;* a star in the virgin's spike; a river so called; illusion; worldly; unreality; the name of a nymph of *swarga*

චෛත්‍ර *s,* the month called *bakmása* (March April)

චය *s.* a collection, a heap, a multitude

චින්තන *s.* reflection, consideration, thought, meditation, contemplation

චින්තාමාණික්‍යය *s.* (චින්තා *thought* මාණික්‍ය *gem*) a fabulous gem, supposed to give its possessor every thing desired

චින්හ *s.* a spot or mark

චිපිට see the following

චිපිටක *s.* rice or grain bruised

චිර or චිරත් *a.* ancient, long, protracted, much

චිරකාල *s.* (චිර *long* කාල *time*) a long period

චිරන්තන *a.* old, very ancient, antiquated, long lasting

චිරපාක *a.* very old, exceedingly ripe

චිරත් *a.* ancient, of long continuance, antiquated

චිරප්‍රාඪක *a.* a very old man, one far advanced in life; long enduring

චිරාත් *s.* a long period, a long time; one of the names of *garuda*

චිරාත්කාලය see චිරකාල

චිරාත්‍ර *s.* (චිර *long* රාත්‍ර *night*) a period of very many nights, a long period; the great bear

චිරි *s.* a parrot

චිරින්ටි *s.* a young woman, a woman staying in her father's house

චිරිබිල්ව *s.* the name of a plant (*galedupa arborea*)

චිබුක *s.* the chin

චිල්ලව *s.* a kind of sprat (*clupea cultrata*); also, a kind of prawn

චිල්ල *s.* the bengal kite (*falco cheela*;) bleared or sore eyes; a cricket; a cutaneous disease

චීන *s.* a country so called, *cochin china;* the native geographers divide this country into two parts චීන and මහාචීන, that is *great china* or china proper, and *cochin china;* a kind of deer; a sort of banner (made of deer skins;) a sort of cloth; a thread; a sort of panic (*panicum miliaceum*); tin

චීනක *s.* *panicum miliaceum*

චීනාකු *s.* the cotton plant (*gossypium religiosum*)

චීනාවුල් *s.* a plant (*cacalia cathartica*)

චීර *s.* cloth, clothes; a rag, old torn cloth; bark, rind; a crest; a kind of garland; lead; a line; a stroke; writing; the dress of the priests

චීරකවාථක *s.* a punishment, pouring boiling lead down the throat

චීරි *s.* an eye cloth, a veil, a covering for the eyes

චීරිකා *s.* a cricket

චිරි *s.* a cricket; the ends or hem of a garment

චිණ්ණව *s.* learning, acquirement, information

චීවරය *s.* the dress of the *buddhist* priests

චීරිකා *s.* a cricket

චුක්‍ර *a.* sour, acid—*s.* sourness, acid seasoning: sorrel; also, the tamarind tree

චුක්‍රිකා, චුක්‍රිකං, චුක්‍රිකී *s.* wood sorrel (*oxulis monadelphia*); another plant, a variety of the *marcilea coromandelina?*

චුකොංචිල *s.* the tamarind tree (*tamarindus indica*)

චුචුව or චූචූක *s.* a nipple

චුච්චුන්දරී *s.* the musk rat

චුචු *s.* the musk rat or shrew

චුචුරි *s.* a game, a kind of hazard played with tamarind seeds instead of dice

චුත *s.* the anus: a mango; that which has fallen; murder, killing, death

චුතව *s.* death, dying; exit, from one state of existence to another

චුති see the foregoing word

චුතෝත්පත්ති *s.* (චුත *dead* උත්පත්තිය *birth*) a new or fresh birth, a transmigration

චුම්බක *s.* a kisser; a lecher; a rogue, a cheat; the load stone; a general scholar, one who knows parts in a variety of books; the upper part or middle of a balance

චුම්බකපාෂාණ *s.* magnet

චුම්බිත *part. a.* from the root චුම්බ to kiss, kissing

චුර *s.* theft, stealing

චුල්ල *s.* a blear eye; a cutaneous disease; an oven;—*a.* little, small, diminutive

චුල්ලි or චුල්ලී *s.* a chimney; a fire place; a funeral pile

චුළුක *s.* mud, mire; a small vessel or pot, a gallipot &c. the hand hollowed to hold water; rinsing the mouth with water held in the palm of the hand

චූඩා *s.* a single lock of hair on the crown of the head; a crest, a plume, a diadem; a peacock's crest; top, summit; an upper room, one on the top of a house; a kind of bracelet; a smallwell

චූඩාල *s.* the head

චූඩාලා *s.* a kind of grass (*kyllinga monocephala*);—*a.* crested, having a lock of hair on the crown of the head

චූතක *s.* the mango; a small or shallow well

චූර්ණ *s.* powder, dust, any pulverized substance; a fossil alkali

චූර්ණක *s.* grain fried and pounded

චූර්ණකං *s.* a sentence in prose expounding the purport of the foregoing *gáthá* or verse

චූලා *s.* an upper room, one on the top of the house; a lock of hair left on the crown of the head; a crest, a diadem; a peacock's crest

චූලිකා *s.* the root of an elephant's ear; *a drama*, the inferior personages of a *drama* collectively

චේටක *s.* a servant, a slave

චේටී *s.* a female servant or slave

චේත or චේතනා *s.* the mind or faculty of reason; the understanding, intelligence; wisdom; reflection; soul; self

චේතක *s.* a dog trained to the chase

චේතකී *s.* the yellow myrobalan (*terminalia chebula*)

චේතනාව *s.* an animal or existent being; a rational or sentient being; the mind, as the seat of thought and reason; understanding

චේතස් or චේතස *s.* mind, intellect, the faculty of reasoning or understanding

චේතා see චේත

චේල *s.* dress, clothes, raiment, cloth;—*a.* vile, bad, wicked

චේලාව *s.* a weapon, a missile weapon

චෛතන්‍ය *s.* soul, spirit; the intellect, the source of thought

චෛතසික *s.* thought, reflection, intellect

චෛත්‍ය *s.* a place of sacrifice or religious worship; as, a temple, a tree, a shed or any place where offerings are made and the deity propitiated; a buddhist *dágoba*; a monument, a tomb or column erected in memory of some deceased person

චෛත්‍ර *s.* the name of a month usually called *bakmása* (March April); a monument erected to the memory of the dead, a column or block of wood &c. being so considered

චෛත්‍රක *s* the month usually called *bakmása* (March April,)

චෛත්‍රමාස see the foregoing

චෛත්‍රරථ *s.* the garden of the god *cuvèra*, the *Indian* Plutus

චොච *s.* bark, rind; skin; cassia bark; cinnamon; half eaten fruit; the fruit of the palm; a banana or plantain; a cocoanut

චොචක *s.* bark, rind

චොඩ *s.* a tank, a pond, a reervoir

චෝද්‍යකය *s* a fault, a flaw

චෝදනාව *s.* a precept, a sacred ordinance; sending, commanding, directing; a fault, a flaw

චෝදණිකා *s.* a plant, a species of the *sida*, white leaved

චෝදිත *a.* published, made known, proclaimed; guilty

චෝර *s.* a thief, a robber; a kind of tree from which a resinous substance is extracted and in some parts of *India* a perfume is made from it (*dipterocarpus turbinatus*) see හොරකස්

චෝරක *s.* an aromatic plant (*kempferia galanga*)

චෝරපුෂ්ප see the foregoing: also, a kind of grass (*andropogan aciculatum*); another kind of plant (*crotularia laburnifolia*)

චෝල *s.* a short jacket, a kind of bodice; also, the name of a country, the modern *Tanjore*

චෝලක *s.* a breast plate; a cuirass; bark, rind

චෞර *s.* a thief, a robber, a pilferer; a plant see චෝරපුෂ්ප

චෞරි *s.* stealing, theft

චෞරික *s.* a thief, a robber, a pilferer

චෞර්‍යය *s.* theft, robbing

චෞල *s.* the beard; the tonsure, a single tuft of hair left on the crown of the head after the rest has been shaven

චෞලකර්ම *s.* the ceremony of cutting off the hair from the head of a *hindu* child at 3 years old

චෞව්‍ය චෞව්‍යක *s.* a kind of pepper (*piper chouvya*)

ඡ

ඡ the preceding consonant aspirated, and is expressed by *ch'ha*

ඡඃ *s.* cutting, dividing

ඡා or ඡ *a.* pure, clean; tremb-

ling, tremulous, unsteady; covering, concealing; an infant child; any young animal
ඡකණ s. fœces
ඡගල s. blue cloth or raiment; a goat
ඡගලක s. a goat
ඡගලා or ඡගලි s. a she goat; a a kind of plant (*convolvulus pescapræ*)
ඡත්ත s. the *páli* form of ඡත්‍ර with some few additional meanings: as, an insignia of royalty, great rapidity &c.
ඡත්තිංසය s. thirty six (number)
ඡත්‍රං s. an umbrella, a parasol
ඡත්‍රක s. a king fisher; a shrub (*leucas zeylanica*)
ඡත්‍රශී s. a side of the human body; the shoulder
ඡත්‍රපර්ණ s a plant (*echites scholaris*)
ඡත්‍රා s. a kind of fennel (*anethum sowa*); the coriander seed; anise; a mushroom
ඡත්‍රාක s. gold; a mushroom; a plant (*mimosa octandra*)
ඡත්‍රාකී s. a plant (*mimosa octandra*)
ඡත්‍රාවාඃ s. a kind of tree, called *devadáru* (*pinus devadáru*)
ඡත්‍රාවිත s. a kind of plant (*leucas zeylanica*)
ඡත්‍රාඝි s. a sort of creeper commonly called තිරස්ස
ඡද s. a leaf; a wing; a plant; bark, rind
ඡදන s. a leaf; a wing; a roof; a covering; a sheath, a scabbard
ඡද see ඡද
ඡදි s. a roof; a covering, a shade
ඡද්දන්ත s. a kind of elephant; also, a large lake in the *himália* mountains
ඡද්ම s. fraud, deceit, trick; disguise, masquerade

ඡන්ද s. meaning, intention, purport, opinion; subjection; poison; wish, desire
ඡන්දය see ඡන්ද
ඡන්දරාගය s. vehement desire, ardent wish
ඡන්දස s. prosody; poetical metre; a peculiar kind of metre such as that of the book *vittódaya*; meaning, purport; object; intention; wish, desire; independent, or uncontrolled desire
ඡන්න a. solitary, private, secret;—s. wish, desire
ඡන්දොවිචිති s. the science or knowledge of the ඡන්දස which see
ඡන්න a. fit, proper, convenient; private, secret; concealed, covered; solitary; clothed, accoutred;—s. an ordinance, a precept
ඡර්දි or ඡර්දි s. vomiting, sickness, retching
ඡර්දනඃ the nimb tree (*melia azadaracta*); a demon
ඡර්දි s. vomiting, retching, sickness at the stomach
ඡර්දික see the foregoing word
ඡව a. dead; low; vile
ඡවක s. a dead body, a corpse; a mean, low, vile person
ඡවඩාහක s. he whose business or place it is to prepare the funeral pile, and burn dead bodies
ඡවි s. moon light; beauty, splendour, effulgence, brilliance, light, lustre
ඡවිකල්‍යාණය s. one of the 5 personal beauties, the beauty of the skin, particularly the lips
ඡවිය see ඡවි
ඡල s. curry &c. stumbling; wickedness, fraud, circumvention, stratagem

ඡල්ලි s. rind, bark; skin

ඡාග s. a goat

ඡාගකණ්ණ s. (ඡාග a goat කණ්ණ an ear) a kind of tree (*terminalia alata*)

ඡාගලකණ්ඩ s. a kind of hemp or flax

ඡාගමෝදිකා s. parsley

ඡාගී or ඡාගිකාව s. a she goat

ඡාත්‍ර s. a scholar, a disciple, a pupil; weakness

ඡාදන s. a roof; a covering, a screen &c. a leaf; disappearance

ඡාදිත a. covered, concealed; cut, divided

ඡාත *past part.* cut, divided, separated

ඡාකණ s. dung, excrement

ඡායා s. a shade, a shadow; a reflected image; any image statue or picture; the wife of the sun; radiance; beauty; splendor, lustre, light; nourishing; a bribe; darkness, obscurity

ඡායාපුත්‍ර s. (ඡායා *the wife of the sun* පුත්‍ර *a son*) one of the names of *saturn*

ඡායාපථ s. (ඡායා *light* පථ *a road*) the firmament; æther

ඡායාරූපය s. a shadow; an image

ඡායාව see ඡායා

ඡායාසුත s. one of the names of *saturn*

ඡිද්‍ර s. a hole, a perforation, a vacuity, any small opening; a fault, a flaw, a defect

ඡිද්‍රිත a. perforated, pierced, having holes or any small openings

ඡින්න see the following word

ඡින්නා s. death; a whore, an harlot;—*a.* cut, divided, broken (as by sorrow)

ඡින්නාගන්ධ s. assafætida

ඡින්නරුහා s. a kind of plant (*menispermum glabrum*)

ඡින්නා s. a kind of plant (*menispermum glabrum*)

ඡින්නොද්භව see the foregoing

ඡිල්ලි s. a plant (*amaranthus polygonoides*)

ඡුරිකා s. a knife, an instrument for cutting

ඡේක a. conversant with; well informed; clever; tame, domesticated, as a bird or beast; citizen, town bred; rakish; buckish, smart, trained in the acuteness and vice of towns

ඡේදන a. cutting, dividing, breaking, separating

ඡේදනා s. what cuts; a breaker

ඡේදිත *past part.* cut, separated, divided

ජ

ජ the third letter of the second class of consonants and the twenty first in the alphabet, and sounds like *ja* in *jam;* also, one of the names of *siva,* and of *vishnu;* birth, production; a parent, a progenitor; poison; light, lustre; an imp, a goblin;—*a.* born

ජංගම properly ජඞ්ගම which see

ජංගාව see ජඞ්ගාව

ජංඝා s. the calf of the leg

ජංඝාල s. a traveller, a journeyer, a pedestrian, a runner, a racer, a quick marcher, a rapid walker

ජංජල s. error, mistake

ජය s. conquest, triumph, victory; light, lustre, brilliancy; speed, rapidity

ජගත් or ජගත s. the world, the universe, the earth; people, mankind; air, wind;—*a.* opulent, renowned

ජගත්සාක්ෂි s. (ජගත් *the earth* සාක්ෂි *witness*) the sun
ජගන්නා s. a renowned, opulent or celebrated person
ජගදීශ්වර s. (ජගද් *the world* ඊශ්වර *lord*) a king
ජගන්නාථ s. (ජගත් *the world* නාථ *lord*) one of the names or forms of *vishnu;* a celebrated idol of this name, is worshipped on the *coromandel* coast in *orissa,* and it is visited by pilgrims from every part of *india*
ජගර or ජගරා s. armour, mail
ජගල or ජගලා s. the toddy or liquid extracted from the cocoanut tree; any vinous liquor for distillation
ජඝන s. mons veneris; the hip, and loins; the haunch
ජඝනජ s. (ජඝන *loins* ජ *born*) a son, a child
ජඝන්‍ය a. last, final, hindmost; low, vile
ජංගම s. moveable, not stationary, locomotive
ජංගමවිෂ s. poison which circulates rapidly through the blood
ජංගල s. a place, a firm spot; a waste, a desart, a *jungle*
ජංගාල s. flesh
ජඞ්ගාව s. the buttocks
ජඞ්ගුල s. poison, venom
ජඤ්ජල s. error, mistake
ජටකාරිකා s. (ජට *clotted hair* කාරිකා *a doer*) one who has long clotted hair and brought over the head, so as to project like a horn from the forehead
ජඨර s. the stomach
ජඨරාග්නි s. the digestive faculty, digestion
ජටා s. entangled, matted or clotted hair; the clotted hair of ascetics; the matted hair as worn by *siva,* as the regent of the clouds and the giver of rain; a cluster of bamboos; entanglement; wish, desire; concupiscence; spikenard
ජටාධර s. (ජටා *entangled hair* ධර *who bears*) one of the names of *siva;* also, an ascetic
ජටාමකුට s. a kind of spikenard
ජටාමාංසී s. *indian* spikenard
ජටාලු s. bdellium
ජටාල s. spikenard
ජටි see ජටී
ජටිල s. a lion; also, an ascetic or religious penitent with clotted hair
ජටිලා s. the *indian* spikenard; long pepper; orris root
ජටී s. a kind of fig tree, the waved-leaf fig tree (*ficus venosa*)
ජඨර s. the belly, the stomach
ජඨර a. hard, firm, bound, tied
ජඨරාග්නිය s. (ජඨර *the stomach* අග්නි *fire*) the fire of the stomach, that is, the bile or digestive faculty
ජඩ a. frosty, cold, frigid, chilly; dull, sluggish in mind or body, stupid, ideotic, apathetic; mean, vile; dumb; hard
ජඩං s. water; lead
ජඩයා s, a paltry, pitiful man, a mean fellow, a low, vile, contemptible person, a block-head
ජඩා s. cowach
ජතු s. lac, a red dye, or animal pigment, analogous to cochineal
ජතුකා s. a bat; see also ජතු
ජන s. man, individually or collectively; mankind, a sentient being; a festival; birth, production
ජනක s. a father, a progenitor
ජනකා s. mankind, a number of men

ජනගහන *s.* (ජන *people* ගහන *a pressure)* a crowd of people, a multitude
ජනන් see the following word
ජනන *s.* birth, production; a family, a race, a lineage
ජනනි *s.* a mother; tenderness, compassion; *arabian jasmin*
ජනපදරෝග *s.* a pestilence
ජනපද *s.* (ජන *man* පද *going*) an inhabited country; mankind
ජනපදිකය *s.* a province
ජනයන් *acc. plur. of* ජන
ජනරඤ්ජනය *s.* (ජන *people* රඤ්ජන *pleasure*) national happiness and prosperity arising from an equitable government, and a due administration of law
ජනසංකීර්ණ *s.* inhabited, peopled, abounding in inhabitants
ජනසඤ්චර *s.* (ජන *people* සඤ්චර *to walk*) an inhabited place, a populous country
ජනසම්බාධ *s.* crowded with people, peopled to excess
ජනශ්‍රැති *s.* news, tidings, intelligence
ජනා the *plur.* of ජන
ජනාර්දන *s.* (ජන *man* අර්දන *worshipping*) he whom man worships, one of the names of *vishnu*
ජනාශ්‍රය *s.* (ජන *man* ආශ්‍රය *an asylum*) a temporary hall, a place for meeting or resting
ජනි *s.* a woman; a mother; birth, production
ජනිත *past. part.* born, produced, brought forth
ජනිතාවය *s.* a birth, a production
ජනී see ජනි
ජනු *s.* birth
ජනේශ්වර *s.* (ජන *man* ඊශ්වර *lord)* a king
ජනෝදාහරණ *s.* fame, glory
ජන්තු *s.* any animal, a sentient being, any being endowed with animal life; it is however, more usually applied to beings of the lowest organization; the collar bone
ජන්තුක *s.* an animal, an animal in general; any animated being
ජන්තුඵල *s.* (ජන්තු *an animal* (worm) ඵල *fruit or leaf)* a kind of fig tree (*ficus glomerata*) the leaves of which swarm with insects
ජන්නු *s.* the knee
ජන්නුකාන් as the foregoing
ජන්ම *s.* born; nature; birth; nation, race, tribe, lineage
ජන්මන් *s.* birth, production
ජන්මාන්තර *s.* (ජන්ම *birth* අන්තර *among*) during human existence from birth to death, the whole life; birth
ජන්‍ය *s.* a father; the friend, attendant or companion of a bridegroom
ජන්‍යං *s.* war, combat; rumor, report; a market, a fair; a portent, one occurring at a birth
ජන්‍යා *s.* a mother; the friend of a mother; a bridesmaid; pleasure, happiness
ජප *s.* an offering to a demon; the muttering of prayers at offering to demons; repeating inaudibly, charms, the names of gods and demons, on certain religious occasions; the practice of *hindu* religious mendicants to count in silence the beads of a rosary
ජපාවල්ල *s.* the chinese rose plant; an aquatic plant (*valisneria)*
ජබාදු *s.* musk
ජබාදුවා *s.* the civet cat
ජම්බාල *s.* mud, clay, mire
ජඹු *s.* water

ජම්බීර s. the lemon; the citron; the common lime; it may be applied to several species of lime; a sort of *basil*

ජම්බු s. a fruit tree, the rose apple (*eugenia jambu*)

ජම්බුක s. a jackall

ජම්බුද්වීප s. (ජම්බු *the rose apple tree* ද්වීප *an island or country*) a country so called from its producing that fruit in abundance; according to the geography of the *hindus* the name of the central division of the universe or the known world; but according to the *buddhists* it is the continent of *india* or more strictly *india proper*, or India within the Ganges, it being generally reckoned by them as the scene of the labours of *buddha*

ජම්භීර a. deep, profound, either naturally or metaphorically; hard, difficult

ජම්බීරය s. see the foregoing

ජම්බූනද s. a kind of gold

ජම්බූල s. the rose apple

ජම්බෝල s. a plant (*citrus decumana*)

ජම්පතී s. a man and wife

ජම්භල see ජන්ම

ජම්භීරි s. the citron or lime tree see ජම්බීර

ජය s. victory, conquest, triumph; one of the names of *yudhistira* in allusion to his warlike character, and the victories he obtained, particularly over the *curus* in the beginning of the fourth age

ජයකේතුව s. (ජය *victory* කේතු *a banner*) a military flag or banner

ජයංකාඩිය see ජයකේතුව

ජයකොන්තය s. a flag, a banner, an ensign; a sceptre

ජයගැනීම from ජයගන්නවා to conquer

ජයන්ත s. a hero and demigod, the son of *indra;* one of the names of *siva;* the moon

ජයන්ති s. one of the names of the goddess *durga;* a flag, a banner; a plant (*æschynomene sesban*)

ජයපාල s. (ජය *victory* පාල *who nourishes*) a king, a sovereign; it is an appellation of several celebrated *hindu* princes; a tree (*crolom tiglium*)

ජයශ්‍රියාව or ජයසිරිය s. the pride or exultation of victory

ජයවූ a. prosperous

ජයසක s a kind of horn, a bugle

ජයා s. one of the names of the goddes *parvati* the wife of *siva;* the 3rd, 8th, and 13th lunar day of either half of the moon; the yellow myrobalan plant

ජර see ජරත්

ජරත් a. old, advanced in years

ජරඨ a. rotten, decayed, old hard, solid; cruel, harsh; infirm; decayed, decrepid

ජරන් a. rotten, decayed, old

ජරණ s. cummin seed: a plant yielding a pungent seed (*nigella indica*); a sort of salt (*bit lobon*); old, decayed; old age, infirmity from decrepitude

ජරණ. s. assafœtida

ජරණා see ජරණ

ජරා s. decay; old age; infirmity (from old age) decrepitude; a tree (*mimusops kauki*); a noted female demon

ජරායු s. the womb, the uterus; a fœtus

ජරාව see ජරා

ජර්ජර s. the emblem or banner of *sakra;* an aquatic plant (*valisneria*);—*a.* old, infirm

ජර්ජරික *a.* torn, ragged; perforated, full of holes; old, decayed

ජල *a.* dull, stupid, idiotic; apathetic; cold, frigid ;—*s.* water; a kind of perfume; the uterus of a cow

ජලකපි *s.* (ජල *water* කපි *an ape*) the gangetic porpoise

ජලකරංක *s.* (ජල *water* කරංක *a cup*) the cocoanut; a shell, a conch; a lotus

ජලකූපි *s.* a whirlpool: a pond; a spring, a well

ජලක්‍රීඩාව *s.* bathing, for amusement

ජලගුල්ම *s.* a whirlpool

ජලචර *s.* (ජල *water* චර *what goes*) a fish

ජලජ *s.* (ජල *water* ජ *born*) a fish: a shell; a lotus

ජලජන *plur.* of the foregoing

ජලජන්තු *s.* (ජල *water* ජන්තු *an animal*) a fish or any marine, aquatic or amphibious animal

ජලජන්ම *s.* (ජල *water* ජන්ම *born*) a lotus

ජලජාසන *s.* (ජලජ *the lotus* ආසන *seat*) one of the names of *brahma* alluding to his being born from or resting upon the lotus which sprung from *vishnu*'s navel

ජලතඩ්ඩිත්තුව *s.* a strangury

ජලතල *s.* (ජල *water* තල *a plain*) the surface of water; the face of the deep

ජලතලාව *s.* (ජල *and* තලාව *a surface*) a place overspread with water; a marsh; the surface of water; a sheet of water

ජලතාල *s.* the *hilsa* or sable fish (*clupea alora*)

ජලතෘණ *s.* (ජල *and* තෘණ *grass*) aquatic grass

ජලදර *s.* a plant (*corchorus acutangulus*)

ජලධාරව *s.* (ජල *and* ධාර *bearing*) a cloud

ජලධි *s.* (ජල *water* ධි from ධා *to have*) the ocean

ජලධිජ *s.* (ජලධි *the ocean* ජ *produced*) the ocean born, one of the names of the goddess *lakshmi*, alluding to the fable, that she was amongst the seven precious things that were recovered at the churning of the ocean, corresponding to *venus* being produced from the froth of the sea

ජලනිධා *s.* the sea, the ocean

ජලනීලී *s.* (ජල *water* නීල *blue*) a blue dye, alluding to its imparting its own tinge to the water, or to the stream, *indigo;* also, an aquatic plant (*vallisneria*)

ජලපති *s.* (ජල *water* පති *chief* or *lord*) one of the names of *varuna*, in his character as the deity presiding over water

ජලපද *s.* a country, a province; people

ජලපිප්පලි *s.* (ජල *water* පිප්පලි *long pepper*) an aquatic plant (*commelina salicifolia*)

ජලපිරිම see ජලප්‍රවාහ

ජලපොලොව *s.* (ජල *water* පොලොව *place*) one of the three foundations on which this universe is supposed to rest

ජලප්‍රවාහ *s.* (ජල *water* ප්‍රවාහ *an overflow*) a flood, an overflow of water, a deluge

ජලමාජිකාව see බැම්බිරිය

ජලමුච් *s.* a cloud

ජලය see ජල

ජලයන්ත්‍රය *s.* (ජල *and* යන්ත්‍ර *a machine*) a water work, a machine for raising water, a a water can for gardens

ජලරංක or ජලරංකු s. (ජල, *water* රංක *greedy*) a bird feeding on fish, and therefore frequenting lakes and swamps, a kind of crane: a gallinule
ජලව්‍යාල s. a watersnake
ජලශම්බුක s. a bivalve shell
ජලසාටිකා s. a cloth used to cover the privities when bathing
ජලශුක්ති s. (ජල *and* ශුක්ති *an oyster*) a bivalve shell
ජලශූක s. an aquatic plant (*valisneria*)
ජලස්තම්භ s. (ජල and ස්තම්භ *a pillar*) a water spout
ජලාටන s. a heron
ජලාටනී s. (ජල and අටන *who goes*) a leech; a fish
ජලාබුජය s. the womb; viviparous
ජලාර්ණවය s. the rainy season; the sea of fresh water
ජලාවර්ත්ත s. an eddy, a whirlpool
ජලාශය s. (ජල *water* ආශය *an abode*) a pond, a tank, a lake, a reservoir, or any piece of water; also, the sea, the ocean; a fragrant grass (*andropogon muricatum*)
ජලාශයං a. stupid, dull, cold, apathetic
ජලාශයඃ see the foregoing word
ජළුකා s. a leech
ජළෞකාඃ s. the leech (water)
ජල්ප *ad* much
ජල්පරූපම් s. (ජල්ප *much* රූපම් *beauty*) a lotus; any water flower
ජලෞකා s. (ජල *water* ඕක *a house*) whose house is water, the leech
ජලෝච්ඡ්වාස s. a drain or channel, made on purpose for carrying off water, or such a channel made naturally by the overflow of water
ජල්පාක s. a singer, a chanter; a chatterer, a prattler a babbler; dissention, wrangling
ජව s. speed, velocity; a racer, a runner; an express; also, a plant (*hibiscus rosa sinensis*)
ජවන් a. swift, expeditious
ජවන s. speed, velocity; a courser, a fleet horse; also, the name of a country see යවන
ජවනාරංග s. the madarin orange (*citrus nobilis*)
ජවනිකා s. a cloth; a screen, a curtain; a wall or screen of cloth surrounding a tent; an outer tent; small trinkling bells such as are some times tied to flags
ජවසම්පන්න a. swift, speedy
ජවා s. the chinese rose
ජවාධිකා s. a race horse, a fleet horse, a courser
ජහානක s. the period when the world will be totally destroyed
ජ a. speedy, swift; eaten; victorious, triumphant
ජාගර s. wakefulness, vigilance, waking; mail, armour
ජාගරිකා s. one who sleeps little
ජාගරියං see ජාගර
ජාගරූක s. one who sleeps little, a watcher
ජාගර්‍යා s. wakefulness, vigilance, waking
ජාංගල s. flesh; the *francoline* partridge; a wood, a jungle
ජාංගලික s. (ජාංගල *a wilderness* ඉක *an aff*) a snake catcher
ජාංගලි a. rural, picturesque, diversified with hill and dale, wood and water (country); wild, barbarous, savage; cowach (*carpopogon pruriens*)
ජාංගුල s. poison, venom
ජාංගුලි s. a snake-catcher, a dealer in antidotes
ජාංගුලික s. a snake catcher, a snake doctor, one who pre-

tends chiefly by charms to cure the bite of serpents and other venomous animals; a dealer in antidotes

ජාඞ්ගුලි *s.* the knowledge of poisons; the possession of charms or drugs, and the employment of them as antidotes; a kind of pot herb (*luffa acutangula*)

ජාත *a.* born, produced, engendered;—*s.* a child, offspring; a kind, class, species, sort; a description; multitude, collection; individuality; specific condition; birth, production

ජාත• see the preceeding word

ජාතක *a.* born, produced;—*s.* birth, production; that which has been born

ජාතකං *s.* an astrological calculation of a nativity

ජාතකපොත *s.* (ජාතක *a birth* පොත *book*) a work of great celebrity among the *buddhists;* it is usually reckoned a history of the 550 births of *buddha*, or more properly of *bōdhisat*, while a candidate for that high and sacred character; the work however only comprehends a narrative of some one principal event or action in the life of *bōdhisat* in each of the births and is recorded to illustrate his wisdom and the benevolence of his character; and at the same time to impress upon mankind moral and religious sentiments; this book is so sacred among the *buddhists* that they will offer to it and worship it

ජාතමාත්‍ර *s.* (ජාත *birth* මාත්‍ර *a moment*) the moment of the birth of a child; the time from which the nativity is cast

ජාතය see ජාත

ජාතරූප *s.* (ජාත *produced* රූප *form*) embodied, assuming shape or form; gold, silver; any precious metal; coined gold

ජාතවේද *s.* (ජාත *born* වේද *the védas* of the *hindus*) fire; gold; one of the names of *agni* the *hindu* god of fire, alluding to a certain legend among them that the *védas* issued from his mouth

ජාතා *s.* a mother, a matron

ජාති *s.* birth, production; reunion of the soul, with some other body; kind, sort, class, species; lineage, race, family, tribe; poetical metre; rhetorical ornament; a plant (*emblic myrobalan*); great flowered jasmin; mace; nutmeg

ජාතිකණා *s.* (ජාත *born* කණා *blind*) one born blind, a man blind from his birth

ජාතිකොරා *s.* a man crippled from his birth

ජාතිකෝෂ *s.* (ජාති *mace* කෝෂ *a sheath or covering*) that which has mace for its covering, nutmeg

ජාතිගොළුවා *s.* a man born dumb

ජාතිපත්‍ර *s.* (ජාති *jasmin* පත්‍ර *leaf*) the leaf of the great flowered jasmin; also, mace

ජාතිඵලා see the following word

ජාතිඵල *s.* (ජාති *mace* ඵල *fruit*) nutmeg; mace?

ජාතිමත් *a.* (ජාති *race, family* මත් *poss. aff.*) honorable, high born, of good family

ජාතිමන්තයා *s.* (derived as ජාතිමත *with the nom: aff*) one of high birth, one of a good family

ජාතිය see ජාති

ජාතියා see ජාති

ජාතිරංග *s.* a kind of gem usually called *clerunga*

ජාතිවේදය s, (ජාති and වේද *affliction*) transmigration

ජාතිසම්පද s. (ජාති *birth* සම්පද *fortunate*) auspicious birth, well born, of good family

ජාතිසම්පන්නා s. one of a good family, one well born, of noble birth

ජාතරූප s. gold

ජාත්‍යසම්භෙද s. (ජාති *family or race* සම්භෙද *breaking*) breaking the breed, interrupting or destroying the lineal descent

ජාතිස්මරඥාන s. (ජාති *birth* ස්මරණ *recollection* ඥාන *knowledge*) one acquainted with what traspired in former births as was *buddha*

ජතුක s. assafætida

ජාතොක්ෂ s. (ජාත *born* උක්ෂ *an ox*) a bullock

ජාත්‍ය a. (ජාත *born* යත් *affix*) well born, of good family; best, excellent; pleasing, beautiful

ජාත්‍යන්ධ s. (ජාති *birth* අන්ධ *blind*) one born blind

ජනපද s. an inhabited country; people, mankind

ජානම s. knowledge, information

ජාතාපත්‍යා s. a woman who has had children

ජානු s. the knee; the cap of the knee

ජානුමණ්ඩලකා s the cap of the knee

ජප s. muttering prayers inaudibly see ජප

ජාබාල s. a goatherd; a sheep fold: a kind of tree commonly called ජාබාල which see

ජාම්බුවන් see ජම්බුවන්

ජාම්බොනද see ජම්බොනද

ජාම s. a period of time, a watch, 4 hours

ජාල්ම s. an unenquiring man

ජාමාතෘ s a daughter's husband, a son in-law; a husband, a lord or master; a friend; the sunflower

ජාමි s. a virtuous and respectable woman; a woman of high rank or caste; a sister

ජම්බුවන් s. the rose apple tree

ජම්බොනද s. gold; a particular kind of gold, said to be produced from the *jambogus*

ජම්භන s. stabbing

ජායා s. a wife, one wedded according to the lawful ritual

ජායාපති s. (ජායා *a wife* පති *a husband*) a husband; also, husband and wife

ජායු s. medicine, a medicament

ජාර s. a paramour, a gallant

ජාරජ s. (ජාර *a paramour* ජ *born*) a bastard, a child born of a woman by her gallant, an adulterine

ජාරි s. medicine, a drug, a medicament

ජාල s. a net; a window, a lattice, an eyelet, a loop hole; a multitude, an assemblage; an unblown flower; pride, arrogance; magic, conjuring, illusion, supernatural deception; the *kadambo* tree; the young fruit of a gourd or cucumber

ජාලක s. a bud, a germ, an unblown flower; a nest; a net; pride; plantain fruit; a multitude; an assemblage; a window shutter

ජාලකය s. a window, a lattice; a loop hole or eye let

ජාලකාවුළුව s. a window

ජාලකාරක s. (ජාල *a net*, a cobweb කාරක *a maker*) a spider

ජාලකිනි s. a sheep, an ewe

ජාලය and ජාලාව see ජාල

ජාලි s. a small kind of cucumber (*tricosanthes diœca*); a medicine or drug; a plant, the trumpet flower (*bignonia chelonoides*)

ජාලික s. one who uses a net, a spider; a fisherman; a hunter

using a net; a cheat, a rogue, a vagabond; a conjuror; a juggler; an ass

ජලිකා *s.* armour, chain armour; a kind of cloth or raiment; woollen cloth; a leech; a window; iron; a maker of nets

ජලිකාවුක්ෂ *s.* a kind of fig tree (*ficus oppositifolia*)

ජලිනී *s.* wish, desire; a kind of plant or creeper (*momordica cylindrica*); a painting room, a room with a particular kind of window or eye let, so as to throw the light conveniently to the painter

ජල්ම *s.* a low man, one of a mean or degraded caste

ජවා *s.* a plant, endive (*cichorium endivia*); a native of *Jáva*; a Malay

ජවාල *s.* a kind of esculent root

ජිගීෂා *s.* emulation, wish to excel or overcome

ජුගුප්සා *s.* filth, dirt, foulness; contempt

ජිඝත්සා or ජිඝත්සු *s.* hunger,—*a.* hungry

ජිංගිනී *s.* a species of *madder* (*rubia manjitha*)

ජ්ඥප්ති *s.* information, intelligence

ජ්ඥපනා *s.* the act of soothing, pacifying, appeasing

ජිත *past part.* conquered, vanquished, overcome, subdued, surpassed; cut,—*a.* divided

ජිතේන්ද්‍රිය *s,* (ජිත *and* ඉන්ද්‍රිය *an organ of sense*) one who has conquered his passions, an ascetic, a sage

ජිත්වර *s.* a winner, a gainer

ජින *s.* one that has conquered, a conqueror; one that has subdued his passions; a sage, a teacher; an ascetic; in the *mythology* of the *hindus* it is the name of an eminent sage, the leader and founder of the *jaina* sect; one of the names of *buddha* as the omniscient

ජිනපුත්‍ර *s.* a name applied to a disciple or priest of *buddha*

ජින්ඩි *s.* a plant (*barleria cristata*)

ජිනේන්ද්‍ර *s.* (ජින *one who has conquered,* (his passions) *a saint* ඉන්ද්‍ර *a lord*) one of the epithets of *buddha*, alluding to his being the chief of the sect of *buddist* ascetics; an ascetic

ජිනවර or ජින්වර *the plur.* of ජින which see

ජීමූතක *s.* a kind of fragrant grass (*cyperus rotundus*)

ජිම්හ *a.* crooked, bent; tortuous

ජිම්හග *s.* (ජිම්හ *and* ග *which goes*) a serpent, a snake, from its going tortuously; saturn; a plant වලාවංකන

ජිම්හලා *s.* an earthquake, or the subterraneous rumbling which accompanies an earthquake

ජිම්හා *s.* the tongue

ජිවුල් *s.* the elephant or wood apple tree (*feronia elephantum* or *cratæva valanga*)

ජිවුල්ලාවු *s.* the gum or resinous substance which oozes from the foregoing tree

ජිව්හා *s.* the tongue

ජිව්හාප *s.* (ජිව්හා *the tongue* ප *who drinks*) a dog; a cat; a tiger; a leopard, the hunting leopard; a bear

ජිෂ්ණු *s.* one of the names of *sakraya* or *indra*

ජීන *s.* an old man

ජීමූත *s.* a cloud; a mountain; an elephant; the *kokila* or *indian* cuckoo; a tree, a sort of *ebony*; a plant or grass (*andropogon serratum*); another sort of grass (*cyperus rotundus*)

a woman's breast; darkness; a nourisher; musk

ජීර *s.* cumin seed; a sacrificial knife; a sword, a scymitar; a sort of panic seed; decay

ජීරක *s.* comin seed

ජීර්ණ *s.* decay, decomposition; the digestive faculty, digestion

ජීර්ණජ්වරය *s.* (ජීර්ණ *digestion* ජ්වර *fever*) a bilious fever

ජීර්ණි *s.* old age, infirmity, decay

ජීව *s.* life, existence; the *sentient* soul; that which is incorporated with the animal body and gives it life, motion, and sensation; livelihood, profession, occupation; a tree; see ජීවන්ත; *brahaspati* regent of the planet *jupiter; brahma* as the soul of the world;—*a* beautiful, pleasing, delightful

ජීවක *a.* living, existing, endowed with life;—*s.* an animal, any living being; a servant, one who gets his livelihood by his service; a snake catcher, a mendicant, or one who lives by begging; one whose life is prolonged by blessings; any medicinal plant; a tree, (*pentaptera tomentosa*); also, a medical practitioner,

ජීවත් the plur of ජීව;—*a*, living, having life, existing

ජීවථ *s.* life, existence; virtue, piety

ජීවද *s.* (ජීව *life* ද from ද, *who gives*) a physician, a medical practitioner

ජීවදායක *s.* (ජීව *life* දායක *a giver*) a drug, a medicament

ජීවන *a.* living, existing:—*s.* life, existence, a living, a sentient being; water; butter; marrow; a plant (*odina wodier*); another plant (*celtis orientalis*

ජීවනයිකා see ජීවන්තිකා

ජීවනය see ජීවන

ජීවනා *s* marrow

ජීවනාලිකා *s.* a plant (*hoya viridiflora*)

ජීවනි *s. jasmin*

ජීවනිය *s.* water

ජීවනීයා *s.* the milk of the breast

ජීවන්ජීවක *s.* (ජීවන් *lives or living* ජීවක *life*) one that is long lived, the name of a bird and supposed to be a pheasant; the *greek* partridge

ජීවන්ත *a* living, existent, having life;—*s.* life, existence; the name of a tree (*celtis orientalis*) a plant (*menispermum glabrum*); yellow myrobalan

ජීවන්ති *s.* the betle plant; see also ජීවන්ත

ජීවන්තික *s.* a fowler, a bird catcher

ජීවන්තිකා *s.* the name of several plants which possess either aromatic or medicinal qualities see ජීවන්ත

ජීවමාන *a.* living, existent, having life, endowed with life

ජීවා *s.* the earth; a bow string; the tinkling of metallic ornament; orris root

ජීවාතු *s.* a drug for reanimating the dead

ජීවාත්මන් *s.* (ජීව *life* ආත්ම *soul*) the vital principle, or spirit; that spiritual essence which renders bodies susceptible of motion or sensation; the animal soul, that princeple of vitality which is a like common to all sentient biengs

ජීවාන්තක *s.* (ජීව *life* අන්තක *end or a destroyer*) the termination of life; a bird catcher, a fowler

ජීවික or ජීවිකා *s.* livelihood; profession or occupation by which a subsistence is obtained

ජීවිකාව *s.* life; livelihood, occupation, any calling by which subsistence is obtained
ජීවිතය *s.* life, existence, being
ජීවිතාන්තය *s.* (ජීවිත *life* අන්ත *end*) end of life, termination of human existence
ජීවිතේන්ද්‍රිය *s.* the heart, considered on the source of life
ජීවිතේශ *s.* (ජීවිත *life* ඊශ *lord*) one of the names of *yama* the regent of death; the moon; a lover; a husband
ජුගුප්සන or ජුගුප්සා *s.* censure, abuse, reproach, reviling
ජුගුප්සිත *a.* censured &c.
ජුඞ *s.* a kind of creeping plant (*ipomea zeylanica*)
ජුෂිත *a.* out cast; deserted; injured; abandoned
ජූති *s.* appetite; light, splendour, effulgence; moonlight; speed, velocity; a running
ජූන්හ or ජූන්හා *s.* the moon; moonlight; the rays of the moon, moon beams
ජූන්හපක්ෂය *s.* the bright half of the moon
ජූර්ත්ති *s.* fever; morbid heat;—*a.* feverish
ජුෂ්ට *a.* sought, enquired after, explored
ජුහු or ජුහූ *s.* a wooden vessel of the shape of a semicircle or crescent and used at sacrifices
ජුහුරණ *s.* the moon; fire; one of the names of *agni* the god of fire
ජූ *s.* æther; the heavens or atmosphere; the goddess *saraswati*; a female demon or goblin; speed, velocity, expedition
ජූට see ජට
ජූත *s.* speed, velocity, expedition
ජූඩුංග *s.* the wood apple tree
ජෙතව්‍ය *s.* conquest, victory; a conqueror
ජෙතා *s.* a conqueror, a victor
ජෛද්‍යාවෛද *s.* a surgeon
ජෙය *a.* conquerable, fit to be conquered;—*s.* a conqueror
ජෙෂ්ඨ *a.* best, most excellent, pre-eminent, first, highest (in rank)
ජෙෂ්ඨමාස *s.* a month so called (May June)
ජෙෂ්ඨා *s.* a chief, a leader; a person of eminence; an elder, one very far advanced in life, a man of age; an elder born
ජෙෂ්ඨා *s.* one of the asterisms, considered as lunar mansions; the 18th, comprising three stars of which one is α *scorpionis* figured by a ring or earring; the middle finger; misfortune; a small house lizard; a month so called (May June)
ජෙෂ්ඨ see ජෙෂ්ඨා
ජෙෂ්ඨාවාස *s.* a name of *sakra* alluding to his residence on *maha meru*
ජෛතා *s.* a conqueror, a victor
ජෛනේන්ද්‍ර *s.* a Sanskrit Grammar so called
ජෛන *s.* among the *hindus* or the natives of the continent of *india* is a follower of the principles of *jaina* a noted *heretic* from Braminism, and who taught a number of heterodox notions to the people; some of the chief are the supremacy of certain religious pontiffs over the gods of the *hindus*, a denial of the divine authority of the *védas*, and a disregard of the distinction of *caste*
ජෛමන *s.* food, victuals
ජෛවාතෘක *s.* the moon; a drug; a medicament;—*a.* long lived

ජ්‍යෙෂ්ඨාත්‍යණ s. a person venerable from age, the moon : a drug, a medicament;—a thin spare
ජ්‍යෙෂ්ඨ s. a month so called (May-June)
ජෝංගක s. aloe wood
ජෝඞ්‍යක as the foregoing
ජෝඩුව s. a pair, a couple
ජෝති s. sun shine, light, effulgence; fire; a star
ජ්‍යොතිඥාන s. (ජ්‍යොති a star ඥාන knowledge) one possessing a knowledge of the planetery system, an astronomer
ජ්‍යොතිමත් a. light, effulgent; shining, glittering
ජ්‍යොතිරථ s. the polestar
ජ්‍යොතිරිංගණ s. a firefly
ජ්‍යොතිර්පාෂ s. a lamp; white sand
ජ්‍යොතිෂ s. the science of astronomy, and astrology
ජ්‍යොතිෂි s. a star, a planet, an asterism
ජ්‍යොතිෂ්ක s. a planetary or heavenly body; the generic term for the sun, the moon, a planet, an asterism, a star; a plant (*plumbago zeylanica*)
ජ්‍යොතිස් s. light; a star; the pupil of the eye; fire, or the god of fire
ජ්‍යොතිපිඨාංශො s. an eminent person so called, often referred to in the *játakas*
ජ්‍යොතිශාස්ත්‍ර s. astronomy
ජ්‍යොතිස්නා s. moonlight, a moonlight night; a small kind of cucumber
ජ්‍යොතිස්නී s. a kind of perfume; a plant (*luffa acutangula*); see also the foregoing word
ජ්‍යොතිස්ඩිකී s. a moonlight night
ජ්‍යොතුමාලිකා s. a punishment inflicted on criminals, by wrapping the body in clothes soaked in oil and then setting fire to them
ජෝෂ s. happiness, felicity, pleasure, enjoyment, satisfaction
ජෝත්සනී s. moonlight, a moon light night, a night in which the moon is full
ජෝසනීයක s. moonlight
ජ්වරය s. a fever, intermitting or continued
ජ්වරාතුරයා s. one sick of a fever
ජ්වල s. flame, blaze, light
ජ්වලන s. *agni* or fire; fervency, zeal; inflammation;—a. blazing, burning,
ජ්වලිත s. burning, blazing, flaming, shining; zeal
ජ්වාල s. flame, blaze
ජෘම්භ s. gaping, yawning, expansion, stretching, swelling
ජෘම්භිත see the foregoing word
ජෘම්භනා s. a sort of plant (*mimosa octandra*)

ඣ

ඣ the *ninth* consonant of the alphabet; the aspirate of the preceeding letter, and is usually expressed by *jha*
ඣ s. sound, like the splashing of water, or the clashing of cymbals; a high wind; a thing lost or mislaid; playing a tune: beating time; one of the names of *brahaspati* the preceptor of the gods; a cascade; sleep
ඣංකාර s. a tinkling sound; a sound as of the voice of birds &c.
ඣටාවාලය s. a tuft of hair on the crown of the head
ඣටිති ad. speedily, swiftly
ඣඨා see ජඨා
ඣම්පා s. a jumping, springing, plunging; hoping, expecting
ඣර s. a cascade, a water fall

ඣ3 *s*. a river ; cymbals

ඣඊඣ *s*. a kind of tom tom or native drum ; cymbals; splitting, dividing

මුදුපල. s. the vine (*vitis vinifera*); also, the grape
මුද්‍රා s. a seal, a seal ring; the mark or impression of a seal
මුදී s. (මුදු *the vine* ඉන් *aff.*) wine, the juice of the grape
මුදිකාපාන s. (මුදු *the vine* ඉක *aff.* පාන *juice*) the expressed juice of the grape, wine
මුද්‍රිකා s. (මුදු *a seal* කන් *aff.*) a sealed or signed paper; a stamp
මුන් s. a sort of kidney bean (*phaseolus mungo*), the *Elu* form of මුද්ග; also, pronoun they, a contraction of මොවුන්, and used disrespectfully
මුන s. end, top, extremity, tip, point
මුනි s. (මන *to reverence*) a holy sage, a pious and learned person, endowed with more or less of a divine nature, or having attained it by rigid abstraction, and mortification; a devotee, an ascetic, one of the names of a *buddha*; also a *rahatun* or highest order of *buddhist* saint; a name of the saint *agastya*; a tree (*butea frondosa*); another tree (*buchanania latifolia*); the heart, as the seat of reason
මුනිඳු s. (මුනි *and* ඉඳු *chief*) a generic name of a *buddha*
මුනිදුම s. a tree (*æschynomene grandiflora*); another tree (*sesbania grandiflora*)
මුනිපුෂ්ප see the last
මුනිභක්ත see මුනිදුම
මුනින්ද්‍ර s. (මුනි *and* ඉන්ද්‍ර *chief*) a generic title of a *buddha*
මුනී see මුනි
මුනුබුරා s. a grand son
මුනෙන s. the point of any sharp instrument; tip, point; also in presence of
මුමන s. thunder; tremour, shaking, tremulous motion
මුය s. the mouth, the *Elu* form of මුඛ
මුර s. surrounding, encircling; watching, guarding
මුරකාරයා s. (මුර *guarding* කර *who does*) a sentry, a guard, a watchman
මුරජ s. (මුර *encircling*, with wood &c. ජ *born*) a tom tom, a drum, a tabor
මුරපල s. (මුර *guarding* පල *a place*) a watch post, a sentinel's post
මුරමඩුව s. (මුර *and* මඩුව *a house*) a watch house, a guard room
මුරැ s. a god, a deity, an immortal
මුරැංගා s. the horse radish tree

(*guilandina moringa*), the root of which can scarcely be distinguished from horse radish, and it's pod is a very good vegetable

මුරුංගි see the last

මුරුංගුසේවතා *s.* (මුරුංගු *and* සේවත *white*) a white species of *murunga*

මුරුත *s.* a tree bearing a beautiful flower (*lagerstrœmia regina*)

මුරුතමල් *s.* (මුරුත *and* මල් *a flower*) the flower of the *lagerstrœmia regina;* also, the ruby

මුරුබෙර *s.* a sort of large tom tom used in the amusements of *swarga*

මුරුවා *s.* a plant (*marsdenia tenacissima*)

මුරුවාදුල් see the last

මූර්ඡනා see මුඡ්ඡනා

මූර්ඡා *s.* fainting, loss of consciousness or perception

මූර්ඡාල see the last

මූර්ඡාව *s.* fainting, loss of consciousness

මූර්ඡාවෙනවා *v.* to swoon, to faint away

මූඡිත *s.* fainting, loss of consciousness or perception; also written මූර්ඡිත

මූර්ඡිතා see the last

මූර්තී *s,* the body; substance, solidity, see මූර්ති; also, a name of *nirwána*

මූර්ති see the last

මූර්විකා *s.* the vine (*vitis vinifera*)

මූර්වා *s.* a sort of creeping plant, from the fibres of which bow strings are made (*sansevіera zeylanica*); also written මූර්වා

මූල් *a.* first, chief, primary; essential; see also the next

මූල *s.* the root of a tree or any plant; origin, commencement; also the nineteenth lunar asterism, see මූලා

මූලාචාරිය *s.* (මූල් *and* ආචාරිය *a blacksmith*) a head or chief of the blacksmith *caste;* also, a chief teacher

මූලාල *s.* the edible root of the lotus

මූලාව *s.* error, delusion, infatuation; straying, wandering; want, need, necessity; exigency, expediency

මුළු *s.* angle, corner, the extremity of a room; boiled rice; a multitude;—*ad.* all, altogether, wholly, totally

මුළුතැන් *s.* a cook house, a kitchen; a royal kitchen

මුළුමනොම්ම *ad.* wholly, totally, altogether, entirely

මුළුළු see the next

මුළුල්ල *s.* whole, all, complete; entire

මුළුසුන් *a.* (මුළු *and* සුන් *destroyed*) completely destroyed, ruined, extirpated

මුල්කොටු *s.* the pangolin

මුල්බිජු *s.* the quantity of seed to be sown in a field

මූල්‍ය *s.* price; hire, wages; money, coin

මුල්ව *a.* chief, principal, primary

මුව *s.* a deer, the *Elu* form of මෘග; the mouth, from මුඛ; a bow; covering, shutting

මුවපුරිඟු *s.* *indian* corn or maize (*zea mays*)

මුවකිරිවැල් *s.* a creeping plant, see the next

මුවකිරිය *s.* a creeping plant (*sarcostemma viminali*)

මුවග *s.* (මුව *and* ග *going*) escaping, fleeing away

මුවගණ *s.* (මුව *a deer* ගණ *a multitude*) a herd of deer

මුවා see the next

මුවත *s.* edge, the edge of a knife; —*a.* sharp, cutting

මුවතනා the *Elu* form of මුගතෘෂ්ණා which see

මුවතඹර *s.* (මුව *and* තඹර *the lotus*) lotus mouthed, an expression of beauty

මුවදෑ *s.* an arrow

මුවදුනී see the next

මුවදුනා *s.* a jackall

මුවදෙන් *s.* (මුව *and* දෙන් *a female*) a female deer, a hind

මුවන් *s.* a tree in general

මුවනා *s.* thunder

මුවනාබි *s.* (මුව *a deer* නාබි *the navel*) musk, the musk being contained in a bag near the navel of the animal

මුවනාමින් *s.* the principal jewel in a crown or mitre

මුවනාබ see the last

මුවමුනු see මුවතඹර

මුවපොල්ල *s.* (මුව *and* පොල්ල *a young animal*) a young deer, one not full grown

මුවමායම *s.* (මුව *a deer* මායම *deception*) animal instinct; but applied particularly to the deer, which is remarkable for it's cunning in eluding it's pursuers

මුවර *s.* the sea of milk, or white sea; a peacock

මුවරද *s.* (මුව *an animal* රද *a king*) the lion; the pollen of flowers; a name of *anangayá*. the *indian* cupid; a peacock; the nectar of flowers

මුවරදද *s.* (මුවර *and* දද *a banner*) a name of *anangayá*, the *indian* cupid

මුවවට *s.* (මුව *mouth* වට *circumference*) the mouth or brim of any vessel

මුවවිට see the last

මුවසිරස *s.* (මුව *a deer* සිරස *a head*) the fifth lunar asterism; figured by the head of a deer; the *Elu* form of මුගශීර්ෂ which see

මුවහත *s.* the sharp edge of a knife, sword &c.

මුවහත්කරනවා *v.* to screen, to shade, to hide, to conceal

මුවා *s.* a screen, a covering, a concealment; a deer; an animal in general

මුවාකරනවා *v.* to hide, to screen, to conceal; to cohabit, to copulate

මුවිඳු *s.* (මුව *an animal* ඉඳු *a lord*) the lion

මුසල *s.* a pestle for cleaning the husks from the rice

මුසලී *s.* a small medicinal plant (*curculigo orchioides*); a small house lizard

මුෂා *s.* a crucible; also see මුසා

මුෂාවාද see මුසාවාද

මුෂ්ටි *s.* the fist, the closed hand; the hilt or handle of a sword; a handful; filching, stealing

මුෂ්ටිකා *s.* a goldsmith

මුෂ්ටිය *s.* the fist, the closed hand; applied also to a *guru* or preceptor who witholds some branches of knowledge from his pupils, through fear of their surpassing himself

මුෂ්ඨිය *s.* a broom, a brush

මූඡා *s.* error, delusion; straying, wandering; fainting, loss of consciousness or perception; a lie, a falsehood; asthma

මූසල see මුසල

මූසලන් see මුසලින්

මූසලී *s.* a small medicinal plant (*curculigo orchioides*); a house lizard

මූසලින් *s.* (මුසල *a pestle* ඉන් *off.*) a name of *balabhadrayá*, alluding to his weapon or club, resembling a pestle

මුසලෙ see මුසල

මුසස s. the erection of the hairs of the body either from pleasure or pain

මූසා s. a crucible; a lie

මුසාවාද s. (මුසා and වාද speaking) a lie, a falsehood, an untruth

මුසාවාදී s. (මුසාවාද a lie ඉන් aff.) a liar

මුසු a. mixed, mingled, combined, the *Elu* form of මිශ්‍ර

මුෂ්ක s. the scrotum, the testicles

මුෂ්කක s. a medicinal plant, bearing a flower resembling that of the *Lignonia indica* or trumpet flower

මුෂ්ටි see මුෂ්ටි

මුස්තා s. a fragrant plant (*cyperus rotundus*)

මුජ්ජා s. a broom, a brush

හුජ්ජ s. the erection of the hairs of the body considered as a mark of exquisite pleasure or pain

මුස්සැන්ද s. a plant (*mussænda frondosa*)

මුහ s. a disease, the asthma

මුහු s. ripening, maturing; mixing, mingling

මුහුකරනවා v. to mix, to mingle; to mature, to ripen

මුහුකල a. ripe, mature

මුහුකුඩ s. the pedicle of a flower

මුහුද s. the sea, the ocean

මුහුදගිනි s. (මුහුද the sea ගිනි fire) the fire of the great hell called *avichi*, supposed to be in the middle of the ocean, and the navel or centre of *jambu-dwipa* or the great southern continent

මුහුදු s. the sea

මුහුදුදූ s. (මුහුදු the sea දූ daughter) a name of *lakshmi*, the *indian* goddess of beauty, and in many respects similar to the *grecian* venus

මුහුදුලුණු s. (මුහුදු the sea ලුණු salt) sea salt

මුහුදුවෙරළ s. the sea shore

මුහුදුසෙම s. (මුහුදු the sea සෙම phlegm) the surf or foam of the sea

මුහුවන් s. leaven; compound, mixture

මුහුණ s. the face, the countenance

මුහුණත් s. (මුහුණ the face අත් hand or end) a name of *ganesá*, the *indian* god of wisdom, alluding to his face which is that of an elephant; also, tip; point

මුහුනාගස් s. a tree, yielding a very fragrant yellow flower (*mimusops elengi*)

මුහුණු s. the face, the countenance

මුහුර්ත s. a division of time, the 30th part of a day and night, or an hour of 48 minutes; an astrologer; a moment, an instant

මුහුල s. the hair of the head, a lock of hair; a crest, a diadem; the hair tied on the top of the head and ornamented

මුහුලස s. a lock of hair; a crest

මුහුඹු s. a bond, a fetter; a tree, see the next

මුහුඹුමල් s. a tree yielding a very fragrant flower (*mimusops elengi*)

මුහුඹුමිණි s. (මුහුඹු and මිණි a gem) a crest, a diadem

මූ s. binding, tying; also *pron.* he, it, this one, spoken of animals or inferiors

මූක a. dumb:—s. a dumb man; a fool, an ideot

මූකල *a.* ripened, motured;—*s.* rice in the husk, paddy

මුකලගෝවි *s.* a sort of cabbage (*brasica oleracea*)

මුකලන් *s.* a forest, an extensive jungle

මුකලම්බා *s.* a calf between one and two years old

මුගුලනා *s.* a full grown calf or one separated from the cow

මුගකොලන් *s.* a plant (*eleusine coracana*)

මුඟුර see මුගුර

මුට්ටුව *s.* a joining, a joint, as in two planks

මුඩ *s.* a fool, an idiot, see මුඪ

මුඩගැබී see මුඪගැබී

මුඩාව *s.* the point of a bow, to which the string is tied

මුඩිය *s.* a lid, a cover

මුඪ *a.* (මුහ to be foolish) foolish, ignorant; cold, apathetic, stupid;—*s.* a fool, an idcot; a sluggard

මුඪගැබී *a.* (මුඪ and ගැබ the womb) unfruitful, barren from disease

මුඪබුද්ධි *s.* (මුඪ and බුද්ධි understanding) stupidity, foolishness; error, mistake in judgment or opinion

මුත *a.* (මු to bind ත aff.) bound, tied

මුතු see මූත්‍ර

මුද *s.* the sea, the ocean, also written මුහුද

මුදු see the last

මුදුඅවර *s.* a plant (*dolichos verrosus*)

මුදුකුදුපාර *s.* a plant (*cacalia maritima*)

මුදුකලාදුරු *s.* a plant (*cyperus arenarius*)

මුදුකොකාවල *s.* a plant (*ornithrope serrata*)

මුදුකංසා *s.* a plant (*urtica latifolia*)

මුදුදද *s.* spurge (*euphorbia maritima*)

මුදුපෙණ *s.* (මුදු and පෙණ froth) the froth or foam of the sea; also, the bone of the cuttle fish, which is supposed to be produced from the froth of the sea

මුදුබින්තඹුරු *s.* a sort of bind weed (*convolvulus pescapræ*)

මුදුපිරුවා *s.* a plant (*sephora tomentosa*)

මුදුමෑ *s.* a sort of kidney bean (*phaseolus caracalla*)

මුදුවරා *s.* a plant (*calatropis gigantea*)

මුදුගම්පලා *s.* a plant (*verbesina biflora*)

මුදුගාල්පන් *s.* a sort of club rush (*scirpus miliaceus*)

මුදෙපුල් see මුදෙව්ල්

මුණ *s.* the face, the countenance

මුණත් see මුහුණත්

මුණග *s.* (මුණ face අග top) top, point, upper extremity

මුණෑල *s.* the jack tree (*artocarpus integrifolia*)

මුණමල්ගස *s.* a tree, producing a very fragrant yellow flower (*mimusops elengi*)

මුණෑට *s.* the kidney bean (*phaseolus mungo*)

මුනිස්සන් *s.* shot, small shot

මුනුවර *s.* the features of the face

මුංඩ see the next

මුං *a.* (මුහ to be foolish) foolish, ignorant, stupid, ideotic;—*s.* a sort of bean (*phaseolus radiatus*)

මූර්ඡනා *s.* fainting, syncope; a tone or interval in the *indian* gamut; there are 21 in all, viz. 7 to each *grama* or octave; their use seems to be to teach the practice of solmisation

මූර්ඡාව *s.* fainting, swooning, loss of consciousness or sense

මූර්ත. *a.* fainting, fainted; loosing cuosciousness; solid, material

මූර්ති *s.* matter, substance; solidity; the body; form, figure, definite shape or image

මූර්ධ *s.* top, summit

මූර්ධජ *s.* (මූර්ධ *top*, of the mouth ජ *produced*) cerebral, the *ta;ūarga* or hard class of consonants

මූර්ධන see මූර්ධ

මූල *s.* a root, the root of a tree: origin, commencement; capital, principal; the root of the *arum campanulatum;* price, money, wages, hire; the rectum

මූලක *s.* (මූල *a root* ක *aff.*) the radish (*raphanus sativus*); a large sort of yam; see also මූලිකා

මූලකාරණය *s.* (මූල *and* කාරණ *cause*) first cause, origin, producing or efficient principle

මූලජ see මූලබීජ

මූලගන්ධ *s.* (මූල *a root* ගන්ධ *scent*) any fragrant root

මූලඵලා *s.* (මූල *a root* ඵලා *vegetable*) any edible root

මූලබීජ *s.* (මූල *and* බීජ *seed*) any plant growing from the root, as the lotus, &c.

මූලව *s.* the rectum

මූලරෝග *s.* (මූල *the rectum* රෝග *disease*) the piles

මූලවාතය *s.* (මූල *the anus* වාතය *wind*) fistula in the anus

මූලවාඃස see the last

මූලික *a.* (මූල *chief* ඉක *aff.*) chief, primary, principal, radical, literally or figuratively

මූලිනි *s.* (මූල *a root* ඉනි *aff.*) a tree in general

මූල්‍ය *s.* price; wages, hire, &c. see මූල

මූෂා *s.* a crucible; a sort of grass (*andropogon serratum*)

මූෂිකා *s.* (මූෂ *to steal* ඉක *aff.*) a rat, a mouse; a tree (*mimosa sirisha*); a crucible

මූෂිකකර්ණී *s.* (මූෂිකා *a rat* කර්ණ *an ear* ඊ *aff.*) an aquatic plant of the *cryptogamia* class (*salvinia cucullata*)

මූෂිකාවලු *s.* a medicinal plant (*hoya hirsuta*)

මූෂිකාහ්වයා see මූෂිකකර්ණී

මෙ the *Elu* form of මෙය which see; *pron.* this

මෙකල *s.* (මෙ *this* කල *time* or මෙ *rain* කල *time*) this time; the present; the rainy season; also, a mountain in the *vindhya* range, where the *nerbudda* river has it's source

මෙකලකන්‍යකා *s.* (මෙකල *and* කන්‍යකා *a daughter*) the *nerbudda* river, having it's source in the *mekala* mountain; also a name of *agni* the god of fire

මෙකලා see මෙඛලා

මෙඩි *pron. fem.* applied only to female servants and slaves, or women of the lowest classes

මෙඛලා *s.* a woman's girdle or zone; a sword belt

මෙඛලාදාමය *s.* (මෙඛලා *and* දාම *a chain*) a woman's ornamented girdle or zone; also, the belt round the waist to which the sword is fastened

මෙඝ *s.* a cloud; rain; a fragrant grass (*cyperus rotundus*)

මෙඝකාල *s.* (මෙඝ *rain* කාල *time*) the rainy season

මෙඝචින්තක *s.* (මෙඝ *a cloud* චින්තක *who thinks*) the *indian* cuckoo (*cuculus melanoculos*); the name alludes to its being supposed to drink nothing but rain, and therefore natu-

rally anxious for cloudy, and rainy weather

මෙඝනාද *s.* (මෙඝ *a cloud* නාද *sound*) the noise or rumbling of a cloud; a tree (*butea frondosa*); a sort of amaranth (*amaranthus polygama*)

මෙඩක *s.* (මිහ *to urine*) a goat, a ram

මෙඩකාලුඩය *s.* (මෙඩක *and* ලුඩ *a fight*) a fight between two rams

මෙත් *s.* friendliness, benevolence, the *Elu* form of මෛත්‍රී

මෙතන *ad.* here, this place

මෙතුවු *s.* a peacock

මෙතුවක් *ad.* so long, so much, so many

මෙතෙ see මෙත්

මෙතෙක් *ad.* so much, about this quantity

මෙතෙර *s.* this side, of a river, the sea, &c.

මෙතැන් *ad.* here, this place; this time, the present

මෙද *s.* (මිහ *to be greasy or unctuous*) marrow, either of the bones or flesh; the caul; fat

මෙදක *s.* the dregs or sediment of toddy, the spirituous liquor extracted from the cocoanut tree; any vinous or spirituous liquor for distillation

මෙදා *s.* a drug, described as a sort of root resembling ginger, it is one of the 8 principal medicaments, and said to be of cooling and emollient properties, and of particular use in fever and consumption

මෙදුර *a.* (මිහ *to be unctuous*) smooth, soft, bland, unctuous

මෙඩස්ය see මෙඩ්‍ය

මෙන් *ad.* like, resembling; as, so

මෙනා *s.* (මන *to know, to understand*) the mind, the reasoning faculty, the seat of reason

මෙනාවි *ad.* this

මෙනේරි *s.* panic grass (*panicum miliaceum*)

මෙනෙනසි *s.* (මෙනා *the mind*, in the ablative) thought, reflection, meditation

මෙනෙහිකරනවා *v.* to meditate, to reflect, to consider

මෙන්ම *ad.* even thus, even so

මෙපවත් *s.* this news or tidings; an affair, a matter under consideration

මෙබදු *ad.* thus, in this manner, in this way; such, such like

මෙම *ad.* even this

මෙයාන් *s.* (මෙ *a cloud* යාන් *vehicle*) a name of *indra* or *sakra*

මෙර *s.* any vinous or spirituous liquor; the mountain *maha méru*, see මේරු; *ad.* other, foreign

මෙරගල *s.* the mountain *méru*, see මේරු

මෙරමා *ad.* others, other, different, foreign

මෙරය *s.* toddy or the spirituous liquor, extracted from the cocoanut tree for distillation

මෙරු see මේරු

මෙලක *s.* see මේලක; also, Ceylon, the island *lanká*

මෙල see මේල

මෙලනා see මේලනා

මෙලන්කාවු *s.* the tool or instru- of a gold or silversmith

මෙලා see මේලා

මෙලි *a.* rich, wealthy

මෙලෙක් *a.* soft, fine, bland, literally or figuratively

මෙලෙස *ad.* thus, so, in this manner

මෙවන් *s.* (මෙ *a cloud* වන් *colour*) the indigo plant

මෙවුන් *s.* pair, couple; copu-

tation; the *Elu* form of මෛථුන

මෙවුන්දම් *s.* copulation, cohabitation

මෙවුල් *s.* a zone, a girdle; the sword belt; the *Elu* form of මේඛලා

මෙවුල්දම් *s.* (මෙවුල් *and* දම් *a chain*) a woman's ornamented girdle, a zone; also, the sword belt

මෙවෙනි *ad.* in this manner, in this form, thus, such like

මෙවැනි see the last

මෙසඳ *ad.* now, at present, at this time

මෙසම්ය see the last

මෙඝේන්ද්‍ර *s.* (මේඝ *a cloud* ඉන්ද්‍ර *an elephant*) a name of *sakra* or *indra*, who has a cloud for his elephant

මෙත්සර්‍ය *s.* covetousness, avarice

මත්සර්‍යසත *s.* (මත්සර්‍ය *covetousness* සත *who has*) *kuvéra* the *indian* god of riches

මෙලෙස *ad.* so, thus

මෙහා *ad.* here, this side or place

මෙහි *ad.* here, in this place

මෙහෙ *ad.* here, hither;—*s.* work, service

මෙහෙකරනවා *v.* to work, to serve, to labour

මෙහෙකරුවා *s.* (මෙහෙ *work* කරුවා *who does*) a servant; an artificer, a workman

මෙහෙය *s.* work, service, labour

මෙහෙලි *s.* an old woman

මෙහෙවරනවා *v.* to eat, used only of a king

මෙහෙවර *s.* a work, a trade, a business; service, employ

මෙහෙසි *s.* a queen, one of the wives of a king, but especially the one who has been anointed or crowned

මෙහෙසුන් *plur.* of the last

මෙහෙසුරු *s.* a name of *iswara* or *siva*, the *Elu* form of මහේශ්වර

මේ *pron.* this

මේක *s.* this (singular)

මේකලාදම see මේඛලාදම

මේඛලා the *Elu* form of මෙවුල්දම

මේඛලා see මෙඛලා

මේඪ්‍ර *s.* the penis

මේඝනාද *s.* thunder; the peacock

මේඝ *s.* (මිහ් *to sprinkle*) a cloud; rain; a fragrant grass (*cyperus rotundus*)

මේඝකාලය *s.* (මේඝ *and* කාල *time*) the rainy season

මේඝකූටය *s.* (මේඝ *and* කූට *a peak*) a condensed cloud heavily charged with rain, and portending a storm

මේඝධ්වනිය *s.* (මේඝ *a cloud* ධ්වනි *sound*) thunder; the rumbling of clouds

මේඝනාද *s.* (මේඝ *and* නාද *voice*) thunder; a peacock; the rumbling of clouds

මේඝමාල *s.* (මේඝ *and* මාල *a row*) a string or row of clouds

මේඝපුෂ්ප *s.* (මේඝ *and* පුෂ්ප *a flower*) a drop of rain, rain; river water; hail

මේඝය see මේඝ

මේඝරව *s.* (මේඝ *and* රව *sound*) thunder

මේඝවර්ණ *s.* (මේඝ *a cloud* වර්ණ *colour*) the indigo plant

මේඝානන්දි *s.* (මේඝ *rain* ආනන්දි *who delights*) a bird, the *indian* cuckoo, which is supposed to drink nothing but rain; the swallow

මේචක *s.* black or dark blue (colour); darkness; sulphuret of antimony; the eye in the peacock's tail

මේචකා *s.* sulphuret of antimony

මේෂ *s.* (මිෂ *to urine*) a sheep; a goat; the penis

මේථුනා see මෛථුනා

මේද s. (මිද *to be greasy or unctuous)* marrow, either of the bones or the flesh

මේදෝජාල see මේදස්

මේදනී see මේදිනී

මේදස් s. marrow, or more properly the serous secretion that spreads amongst the muscular fibres, and which is considered as performing the same functions to the flesh, that the marrow of the bones does to them

මේදා s. a drug, see මෙදා; also, apprehension, understanding, see මේධා

මේදිනී s. the earth

මේද්‍ය see මේධ්‍ය

මේධ s. wisdom, knowledge; apprehension, understanding

මේධාවී s. (මේධා *and* වී *who goes or possesses)* a wise man, one who has perceived or understands the advantages of religion

මේධි s. a post in the centre of a threshing floor, to which the cattle are attached when they turn round to tread out the corn

මේධ s. sacrifice, offering, oblation; comprehension, understanding

මේධ්‍ය a. pure, purified, duly prepared or made fit to be offered; a kind of orris root

මේධ්‍යගන්ධ s. musk

මේරු s. the sacred mountain *méru* in the centre of the four great continents, compared by the *sinhalese*, to the tabor, and encircled by the seven seas called *sídantas*, which are separated from each other by seven circular rocks, the residences of various demigods, demons, sprites and *gurulas*, &c. and are under the sway of the four *waran deviyó*, or regents of the four points of the compass; the height of *méru* is said to be 84,000 *yoduns* or *yójanas* 42,000 of which are below the surface of the earth; on it's top *sakra* holds his court surrounded by the gods of *swarga*, and underneath it's base is the residence of the *asuras*

මේරුපර්වතය see the last

මේල s. meeting, union, assemblage; antimony or any collyrium

මේලක s. meeting, assemblage

මේලනා s. union, assemblage, meeting

මේවර s. a message; work, service, time allotted for work; a variegated colour

මේෂ s. a ram; a sign of the zodiac, *aries*

මේෂශ්‍රුංගී see මේෂශෘංගී

මේෂශෘංගී s. (මේෂ *and* ශෘංගී *a horn)* a ram's horn; a plant (*gomphocarpus volubilis*); also a creeping plant (*asclepias gigantia)*; a sort of poison usually *wachanáwi*

මේෂාක්ෂි s. (මේෂ *a ram* අක්ෂ *the eye)* a sort of *cassia*, the flower of which resembles the eye of a ram

මේස see මේෂ

මේසා *ind.* so much, so many, as much as

මේහ s. (මිහ *to urine*) urinary disease, especially inflammatory affection of the *urethra*, including gonorrhea, &c.

මෛත්‍රී s. (මිත්‍ර *a friend*) friendship; the 17th lunar asterism commonly called *anurinekata*; —*ad.* friendly, amicable; the name of the next *buddha*

මෛත්‍රීබල *s.* (මෛත්‍රී *and* බල *strength*) a name of *buddha*, alluding to his gentle or pacific character

මෛත්‍රේය *s.* (මිත්‍ර *a frirnd* ඒය *aff.*) a name of *maitri buddha*

මෛථුන *s.* (මිථුන *a couple* අණ් *aff.*) copulation; union, association

මෛල් *s.* the hair of the body; a maternal uncle

මෛල *s.* a tree (*lythrum frutescens*); also, mountain ebony (*bauhinia parviflora*)

මෛලනුවන් *s.* a maternal uncle

මෛලමල් *s.* (මෛල *and* මල් *a flower*) the flower of the *lythrum frutescens*

මොක් *s.* freedom from transmigration, eternal emancipation, *nirwána;* the *Elu* form of මෝක්ෂ;—*a.* high, honorable, best; chief, pre-eminent, from මුඩ්ෂ

මොකද *ind.* an interrogative, what? how?

මොකාදුරු *s.* (මොක් *final emancipation* ඇදුරු *a teacher*) a name of *buddha*, alluding to his character as the instructor in the doctrine of *nirwána;* a spiritual preceptor

මොකවත් *ind.* something, any thing

මොක්ෂ see මෝක්ෂ

මොග්ගල්ලාන *s.* a name of one of *buddha's* two chief *sráwakas* or disciples, commonly called *mugalan*, and who was famed for his *irdhi bala* or supernatural powers, acquired by the most intense performance of devout meditation; but particularly of the *dhyána*, he being the only person that ever performed the *pancha dhyána*

මෝද *s.* (මුද *to be glad*) joy, gladness, delight

මොනා *ind.* an interrogative, what? also —*s.* the face

මොණර *s.* a peacock

මොණරගණා *s.* (මොණර *and* ගණා *an assemblage*) a flock of peacocks

මොණරමල් *s.* the flower fence (*poinciana pulcherrima*)

මොණරපිලි *s.* (මොණර *and* පිලි *a feather*) a peacock's tail or the feathers of his tail

මොණරයන්ත්‍රය *s.* (මොණර *a peacock* යන්ත්‍රය *a machine*) a sort of balloon or flying apparatus

මොනවට *ad.* good, excellently, well;—*a.* beautiful, comely, fair

මොනොවට *a.* good, excellent, best; pleasing, delightful, agreeable

මොරහැඬුම *s.* a noise, the noise of tumult, a loud cry or scream

මොරගහ *s.* a fruit tree (*asclepias acida*)

මොරට *s.* a species of cassia (*cassia articulata*); the root of the sugar cane

මොරවා see මෝරවා

මොරඩ see මොරට

මෝරු *s.* whey; also the sphark

මොල *s.* an arrow; the brain, marrow

මොලකටුව *s.* (මොල *the brain* කටුව *a skull*) the skull

මොලොක් *a.* soft, tender, delicate; supple, flexible; smooth, unctuous

මොල්ලිය *s.* the hump on the back of the *indian* bullock

මොවිටා *s.* (මො for මුව *the mouth* වට *circumference*) the rim or mouth of a vessel; the circular rim of any thing

මොළුදු *s.* a feast, a festival
මොහුන් *pron.* they, these, speaking of persons present
මොහු *sing.* of the last
මෝහනා *s.* (මුහ *to be foolish*) error, ignorance, folly; seeing every thing through a false medium
මොහොත *s.* a division of time, the 30th part of a day and night, or an hour of 48 minutes; a moment, an instant
මොහොරය *s.* a mat for wiping the feet
මොහොෂ්ඨ properly මුහුර්ත
මොහොල් see මෝල
මොහොල *s.* a pestle for cleaning the husk from the rice; the *Elu* form of මුසල
මෝක්ෂය *s.* (මෝක්ෂ *to free, to discharge, to let go*) *nirwána* or final emancipation; final and eternal happiness; the liberation of the soul from the body and it's exemption from further transmigration; death, liberation, freedom
මෝක්ෂඥාන *s.* (මෝක්ෂ *and* ඥාන *knowledge*) the knowledge of the means for the attainment of *nirwána* as revealed by *buddha*, see the last
මෝක්ෂෝපාය *s.* (මෝක්ෂ *emancipation* උපාය *means*) a religious ascetic, a devotee
මෝඝ *a.* (මුහ *to be foolish*) vain, foolish, fruitless, useless; left, abandoned;—*s.* the trumpet flower
මෝඝපුරුෂයා *s.* (මෝඝ *and* පුරුෂයා *a man*) a vain empty person, a useless man; a term of reproof, the strongest ever used by *buddha* in addressing man
මෝච *s.* a tree (*morunga hyperanthera*); the silk cotton tree (*bombax heptaphyllum*); the jack tree (*artocarpus integrifolia*); the plantain tree (*musa sapientium*)
මෝචක *s.* a tree (*morunga hyperanthera*); the silk cotton tree; the plaintain tree; a devotee, an ascetic freed from all passion
මෝද *s.* (මුද *to rejoice*) joy, delight, happiness
මෝදක *s.* a sort of sweet meat
මෝදන *s.* pleasing, delighting, causing joy or happiness
මෝන the *Páli* form of මෞන
මෝනෙය්‍ය the *Páli* form of මෞනෙය
මෝර see මෝරා
මෝරට *s.* a sort of cassia (*cassia articulata*); the root of the sugar cane
මෝරටා *s.* a creeping plant (*sanseviera zeylanica*)
මෝරනවා *v.* to ripen, to become ripe or mature
මෝරා *s.* a shark, a generic name for any fish of the shark tribe; also, a peacock
මෝරු *s.* whey
මෝල *s.* a pestle for cleaning the husk from the rice
මෝවට *s.* (මෝ *for* මුව *the mouth* වට *circumference*) the rim or circular mouth of any vessel
මෝෂක *s.* (මුෂ *to steal*) a thief, a pilferer
මෝහ *s.* (මුහ *to be foolish*) ignorance, folly, foolishness; fainting, loss of consciousness or sense
මෝහන *s.* one of the arrows of *kámadéva*; temptation, seduction, the overpowering of reason and reflection by wordly or sensual allurements; the thorn apple (*datura metel*); fascinating; stupifying, depriving of sense or understanding

මෝහය see මෝහ.
මෝහිනී s. (මෝහන *fascinating* ඉනී *fem. aff.*) a female devil or rather a personification of lust, supposed to overpower reason and reflection by worldly or sensual allurements
මෝඩ s. (මෝහ *ignorance* ඉන් *aff.*) a fool, an ignorant or deluded man
මෑ s. a mother, a matron
මෑකුස s. the womb
මෝක්තිකං s. (මුක්ත *a pearl* ඉක *aff.*) a pearl
මෝදගලස see මුද්ගලස
මෞන s. (මුනි *a sage who practises silence* අණ් *aff.*) silence, taciturnity
මෞනින් s. (මෞන *silence* ඉන් *aff.*) an ascetic, a hermit, a religious sage
මෑපිය s. (මෑ *mother* පිය *father*) parents
මෞලි s. a lock of hair on the crown of the head; hair ornamented and braided round the head; a diadem, a tiara; the head; the earth
මෞර්වී s. (මූර්වා *sanseviera zeylanica &c.* අණ් *aff.*) a bow string
මෞහූර්තික s. (මුහූර්ත *an hour* අණ් *pleonastic* and ඉක් *aff.*) an astrologer
මැං s. juggling, practising the tricks of a juggler
මැංකාරු s. (මැං *juggling* කාරු *who does*) a juggler, one who practises sleight of hand
මැංකාලිය s. a plant (*sapium indica*)
මැංකුර or මැංකූරු s. a juggler
මැංකෙනවා the neuter form of the verb මකනවා
මැංචිය s. perceiving, looking, beholding: sight, seeing
මැටි s. clay, mould, earth
මැඩ s. a ram, a goat, from මෙ

ඩ ? also, rubbing, grinding, from මර්දන
මැඩපවත්වනවා v. to humble, to subdue, to bring into subjection
මැඩුරු a. conquered, subdued, reduced under subjection
මැඩවිල s. a small lake, a pond, a tank
මැඩවීම verbal noun of මඩිනවා
මැඩහැලු s. a creeping plant (*gomphocarpus volubilis*)
මැඩි see මැඩියා;—*a.* crushed, squeezed
මැඩියාහය s. a tree, a species of the oleander (*apocy nonerium*)
මැඩියා s. a frog
මැඩිලිය s. a basket, or any article made of leaves, bark &c. serving that purpose
මැඩිල්ල s. a jungle, a thicket: a ring, a circle; the disc of the sun or moon, the *Elu* form of මඩල
මැඩිල්ලා s. a sort of serpent, the *eye snake*
මැඩිකුණ s. (මැඩි *squeezed* කුණු *particles*) the refuse of the cocoanut after the milk has been expressed
මැති s. counsel, advice
මැති s. kindness, benevolence; a counsellor, an adviser, a king's minister
මැතිඳුම් s. (මැති *and* උතුම *chief*) a chief counsellor, the prime minister of state
මැතිඳුම් see the last
මැන්ඩො s. a sort of currant (*ribes striatum*)
මැද s. the middle, the centre, the *Elu* form of මධ්‍ය
මැදපෙදෙස s. the middle of the body, the waist; see also මධ්‍යදේශ
මැදපෙදෙස see the last
මැදහත් a. (මැද *middle, between* හත් *from* සථා *what stands*)

interposing, advocating, reconciling, coming in between two parties to procure peace; middle, central

මැදහත්කාර s. (මැදහත් *reconciling* කාර *who does*) a judge; an umpire, an arbitrator, a mediator

මැදින් s. a month so called (March April), the last of the *singhalese* year

මැදින්දින see the foregoing

මැදිර s. a cat; a bird cage, an aviary; a house; a temple; the *Elu* form of මන්දිර

මැදිම the *Elu* form of මධ්‍ය

මැදිවයස s. (මැදි *middle* වයස *time of life*) middle age, manhood, prime of life

මැදුම් a. middle, centrical, intervening; large, great

මැදුම්පොල්ල s. a small piece of wood used by the *toddy* drawers or men who extract the liquor from the cocoanut tree, to beat the flower, and make the liquor exude more freely

මැදුම්සඟිය s. (මැදුම් *and* සඟිය *a collection or compilation*) the second of the 5 divisions of *sútra pitaka*, comprizing 15 books or 152 *sútras*

මැදුර s. a house, a dwelling; a bird cage

මැද්ද another form of මැද which see

මැණ s. a gem, a jewel, the *Elu* form of මණි

මැනව ad. an affix to verbs generally used in a precative sense, and answering to good, well, if you please &c, and used only in addressing superiors

මැනුම් s. a feast, a festival, an auspicious or joyful occasion

මැණික් see the next

මැණික s. a gem, a jewel, any precious stone or costly ornament, from මාණික්‍ය

මැණික්කටුව s. the wrist

මැණික්වැන්නා s. a small medicinal plant, not ascertained

මැනො see මැනව

මැර s. a ray of light, a sun beam; a fence, a limit, a boundary

මැරෙනවා v. to die, to expire

මැල s. a maternal uncle

මැලක් a. soft, liquid; supple

මැලගැසිම s. the burning of a thicket, the conflagration of a forest

මැලය s. a large fire, a conflagration;—*a.* withered, drooped as a flower

මැලවෙනවා v. to wither, to droop, to die as a flower

මැලසි a. soft, tender, delicate; —s. young unripe fruit

මැල s. laziness, indolence; antimony

මැලි a. lazy, indolent

මැලියම් s. gum, glue, any glutinous substance exuding from trees or plants on incision

මැල්ල s. a plant (*olax zeylanica*)

මැවිල්ල s. a creature, a created being or substance

මැවීම s. verbal noun of මවනවා

මැවෙනවා verb neuter of මවනවා

මැවුම්කාර s. (මැවුම *and* කාර *who does*) a creator

මැවුම s. creation, creating

මැස s. the body; a bed; also, the plural of මැස්ස

මැසිඳ s. a mineral substance of a dark colour, used medicinally, and is apparently the common pyritic iron ore

මැසිමිලවා s. a small or young fly

මැසිල්ල s. a stitching, a sewing, any thing to be stitched

මැසිවිල්ල *s.* prayer in affliction or sorrow, asking for a blessing after a misfortune

මැසිසමෝහම *s.* (මැසි *and* සමෝහම *an assemblage*) a swarm of bees

මැසිපුණු see මැසිදු

මැසිසෙජ් *s.* the palm of the hand; a platform

මැසෙනවා *v.* to be stitched; to be closed or shut; metaphorically, to be unable to answer

මැස්ස *s.* any small erection made of sticks; a place to sit or sleep upon; a raised floor or platform in the rice fields, on which a person is stationed to watch the grain; a water stand made of sticks; a hurdle; a hen coop made of wicker work &c.

මැස්සා *s.* a fly, a fly in general

මැහැණියන් see the next

මැහැණියො *s.* a mother

මැගිතූස *s.* a string

මැසිපාදිය *s.* a swarm of flies or bees

මැහුම *s.* stitching, sewing, work to be sewed

මැහුම්කාරයා *s.* (මැහුම *and* කාර *who does*) a tailor, a seamster

මැහැලි *s.* an old woman, a matron or elderly woman, from මහල්ලී

මැහැල්ල see the foregoing

මෑ *s.* a general name for beans or pulse; a mother; *pron.* this (woman), used only of inferiors

මෑත් see the next

මෑත *adv.* here, in this place, near

මෑණියන් *s.* a mother

මෘග *s.* a deer; an antelope; an animal in general; research, inquiry, investigation; asking, soliciting, begging; the 5th. lunar constellation, see මෘගශිරස්; the month in which the moom is full in *mrigasiras*; musk; hunting, chase

මෘගතෘෂ්ණා see මෘගප්‍රිය

මෘගධේනුව *s.* the hind

මෘගනාභි *s.* (මෘග *a deer* නාභි *the navel*) musk; the musk being formed in a bag attached to the belly of the animal about the navel

මෘගනාභිජ *s.* (මෘග *a deer* නාභි *the navel* ජ *born*) musk; see the foregoing

මෘගනෙත්‍රී *s.* (මෘග *a deer* නෙත්‍ර *the eye* ඊ *aff. fem.*) an epithet applied to women expressive of beauty, the deer eyed one

මෘගපති *s.* (මෘග *animal* පති *chief*) the lion

මෘගප්‍රිය *s.* (මෘග *deer* ප්‍රිය *what delights*) a sultry vapour which floats over lands and deserts in the hot seasons and has the appearence of water and waves; by it the deer are deceived when in search of water

මෘගවෘන්ද *s.* a flock of deer

මෘගමද *s.* (මෘග *deer* මද *secretion*) musk; see මෘගනාභි

මෘගමායන් *s.* (මෘග *and* මායන් *deception*) animal instinct, but particularly applied to the deer which is remarkable for its cunning in eluding its pursuers

මෘගයා see මෘග

මෘගරාජ *s.* (මෘග *animal* රාජ *king*) the lion

මෘගශිරස් *s.* (මෘග *a deer* ශිරස් *head*) the 5th lunar mansion containing 3 stars, one of which is λ *orionis* and figured by an antelope's head

මෘගශීර්ෂ see the foregoing

මෘගාක්ෂි *s.* (මෘග *deer* අක්ෂි *eye*) bitter apple (*cucumis cologuin-*

*tida);* a woman with an eye like that of the deer, and considered a mark of great beauty

මෘගාඬජ s. (මෘග *a deer* අඬ *a testicle* ජ *produced*) musk

මෘගාදන s. (මෘග *and* අදන *eating*) the hyena; the leopard

මෘගාදනී s. (මෘග *a deer* අදන *eating*) the hyena; the leopard; a plant, colocynth (*cucumis coloquintida*)

මෘගාරි s. (මෘග *a deer* අරි *enemy*) the lion

මෘගාවිධ s. (මෘග *a deer* විධ *from* වධ *who destroys*) a hunter, a deer killer

මෘගේන්ද්‍ර s. (මෘග *an animal* ඉන්ද්‍ර *lord, master*) the lion

මෘජ s. the act of cleaning the body by washing and anointing it with ashes of sandal wood &c.

මෘණාල s. the film or fibres attached to the stalk of the lotus

මෘත් s. earth, clay, soil

මෘත a. dead, expired, extinct

මෘතක s. a dead body, a corpse

මෘතකාන්තක s. (මෘතක *and* අන්තක *fond of*) a jackall

මෘතලතා s. a creeping plant, holy bazil (*ocymum sanctum*)

මෘත්ස්නා s. good soil or earth; a sort of fragrant earth, *surat* earth

මෘතොත්භව s. the sea, the ocean

මෘත්භාජන s. any earthen vessel

මෘත්‍යුරාජ s. (මෘත්‍යු *death* රාජ *king*) one of the names of *yama* alluding to his being the regent of death, and sovereign of the final destinies of men

මෘදඟ s. a tom tom or native drum, a tabor; a sound, a noise

මෘදඟධ්වනි s. the sound of the tabor

මෘදු a. soft; blunt, not sharp; gentle, mild;—s. the brown grape

මෘදුකාන්තක s. a plant (*barleria prionites*)

මෘදුත්වචා s. down

මෘදුත්වච s. (මෘදු *soft* ත්වච *skin*) the *bhójapatra* tree, the bark of which peels off like that of the birch, and is used in making *hooka* snakes

මෘදුපුෂ්ප s. (මෘදු *soft* පුෂ්ප *flower*) the *sirisha* tree (*mimosa sirisha*)

මෘදුත්පල s. (මෘදු *soft* උත්පල *a lotus*) the blue lotus (*nymphæa cærulea*)

මෘවිකා s. the vine

මෘනාල s. the film or fibres attached to the stalk of the lotus

මෘනාලම් see the foregoing word

මෘනාලිකා see මෘනාල

මෘෂා a. false; useless, in vain

මෘෂාර්ථක s. (මෘෂා *false* අර්ථ *meaning*) an impossibility, an absurdity, (in speech or composition)

මෘෂාවාද s. (මෘෂා *false* වාද *speech, praise*) irony, ironical praise; speaking falsely, lying

මෘෂාවාදී s. (මෘෂා *false* වාදී *who speaks*) speaking falsely, lying; a liar, a false accuser, one who brings forward an unjust accusation

මෘංක්ෂ s. a star; a constellation, an asterism

මෘංගාදන s. (මෘංග *a deer* අදන *who eats*) the hyena; the leopard; colocynth (*cucumis coloquintida*)

මෘංගානාභි see මෘගනාභි

මෘංජ s. a musical instrument, probably a sort of tabor or drum; cleaning the body, by washing, anointing &c. ablution, purification

මෘංඩ s. a name of *siva*

මෘඩානී *s.* the wife of *siva*

මෘඩ *s.* (මෘඩ *to hurt, to kill*) one of the names of *siva* alluding to his warlike character

මෘත *a.* dead, expired, extinct, defunct

මෘතාංශු *s.* (මෘත *and* අංශු *ray*) the moon

මෘත්‍යුඤ්ජය *s.* one of the names of *siva*

මෘත්තිකා *s.* clay, earth, soil

මෘත්සා *s.* good or rich soil; a fragrant earth

මෘත්සනා see the foregoing word

මෘදංග *s.* a tabor; a small drum; a double drum; a sound, a noise; a bamboo

මෘදුල *a.* soft ;—*s.* water

මෘණාල *s.* the stalk or stem of the lotus; the film or fibres of the stalk of the lotus

මෘෂාවාද see මුෂාවාද

මෘෂ්ට *a.* clean, cleansed

ම්ලාන *s.* (ම්ලෛ *to be languid*) weariness, languor

ම්ලෙච්ඡ *s.* (ම්ලෙච්ඡ *to speak incorrectly or in a barbarous dialect*) the generic term for a barbarian or foreigner, a savage, one of an uncivilized race; barbarous speech

ම්ලෙච්ඡිත *s.* (ම්ලෙච්ඡ *to speak incorrectly &c.*) a foreigner; barbarous language

## ය

ය the twenty sixth consonant of the *singhalese* alphabet; it is the first of the miscellaneous class of letters and may be considered a semivowel, expressed by *ya* in *yarn* ;—*s.* iron

යං properly යම්

යක see යකා

යකඩ *s.* iron

යකඩමල *s.* (යකඩ *iron* මල *excrescence*) the rust which collects on iron

යකැදුරා *s.* (යක *a demon* ඇදුරා *a teacher*) a person skilled in the invocation and worship of demons; an exocrist, an expeller of demons

යකන *s.* the liver

යකා *s.* a devil, the *Elu* form of යක්ෂ which see; *pron.* which (of many)

යකිනාරන් *s.* a plant (*limonia monophylla*)

යකින්නි *s.* a female devil, see යක්ෂිණී

යක්කු *plur.* of යකා

යකුල *s.* a smith's sledge hammer

යකෙරබු *s.* a sort of coral tree (*erythrina picta*)

යක්කොමඩු *s.* the cucumber plant (*cucumis colocynthis*)

යක්දුර *s.* (යක් *and* දුර *who has*) a demoniac, one possessed

යක්බෙරිය *s.* a small plant (*crotalaria laburnifolia*)

යක්මල් *s.* the african mary gold (*tagetes erecta*)

යකෘත් *s.* (ය *union*, of the parts of the body, කෘත් *what makes*) the liver

යක්රද *s.* (යක් *and* රද *king*) a name of *kuvéra* or *wæsamuni*, regent of the north and king of the demon race

යක්ෂ *s.* (යජ *to offer, to worship to associate*) a demon, good or bad, considered as an object of worship; an infernal spirit, a devil; the latter meanings are most common, hence the worship of devils almost universally prevails amongst the *singhalese* inhabitants, see යක්ෂබලිය; in the mythology of the *hindus*, a kind of fiend or demigod, especially

those who are attendant on *kuvéra*, the *indian* god of wealth, and employed as guardians of his treasures and gardens

යක්ෂධූපය s. a plant, the trumpet flower (*bignonia suaveolens*)

යක්ෂධූප s. (යක්ෂ *a demigod or demon* ධූප *perfume, incense*) resin in general; turpentine; the resinous exudation of the pine; this substance is much used in the worship of devils and at the invocation of demons; during the performance of the ceremonies, the officiating priest holds a lighted torch in one hand, and with the other throws the resin, pulverized and mixed with a small quantity of nitre, into the flame, which produces a considerable flash, and a strong perfume, supposed to be agreeable to the demon and tending to propitiate him

යක්ෂනීය a. devilish, infernal, demoniacal; relating or belonging to a *yaksha*

යක්ෂපුරය s. (යක්ෂ *and* පුර *city*) the city of *kuvéra* or *wæsamuni*, the regent of the north quarter, and king of the demon race

යක්ෂමෙන් s. pulmonary consumption

යක්ෂයා see යක්ෂ

යක්ෂරාජ s. (යක්ෂ *a demon* රාජ *a king*) a name of *kuvéra* or *wæsamuni* king of the *yakshas* or demon race

යක්ෂරාජ see the foregoing

යක්ෂවෘක්ෂ s. (යක්ෂ *a demon* වෘක්ෂ *a tree*) a tree (*beleric myrobalan*), supposed to be the favourite haunt of sprites and demons

යක්ෂාවාස s. (යක්ෂ *a demigod* ආවාස *abode*) the *indian* fig tree (*ficus indica*); see also the foregoing

යක්ෂිණී s. (යක්ෂ *and* ඉණී *aff.*) a female devil, a fury; the wife of *kuvèra*; the wife of a *yaksha*; a female fiend attached to the service of *durga*, and frequently maintaining like a sylph or fairy an intercourse with mortals

යක්ෂ්මන් s. pulmonary consumption

යක්ඛය properly යක්ෂ which see

යක්සෙනේ s. (යක් *and* සෙනේ *an army*) a multitude or company of devils

යගණ s. a poetical triplet, having the first foot short and the two last long

යගුල s. a bar of iron

යඟ s. pleasure, joy, happiness, enjoyment

යජ a root, signifying, to offer, to worship; to present, to endow

යජමාන s. (යජ *to worship* මාන *aff.* of the present participle) a person who institutes a sacrifice, employs the priests and pays all the expences attending it

යජී s. (යජ *to offer* ඉන් *aff.*) a sacrificer, see the last

යජුර්වේද s. (යජුස් *and* වේද *a véda*) one of the four *védas* of the *hindus*; it is divided into two parts, the black and the white; both portions of this *véda* are chiefly on religious rites, and the prayers peculiar to it are chiefly in measured and poetical prose

යජුස් s. (යජ *to worship*) the *yajur véda*, see the last

යඥ s. (යජ් *to offer, to worship*) a sacrifice, a ceremony, in which oblations are presented

යඥයෝග්‍ය s. (යඥ *a sacrifice* යෝග්‍ය *fit*) that which is fit to be offered, prepared by purification &c; a sort of fig tree (*ficus glomerata*)

යඥෂ්ටා s. (යඥ *a sacrifice* ස්ථා *to stay or be*) an offerer, a sacrificer, one disposed or accustomed to make offerings

යඥාංග s. (යඥ *and* අංග *a member*) the glomerous fig; a plant (*siphonanthus indica*); a part of any sacrifice

යඥීය a. proper, or suitable for a sacrifice

යට *ad.* under, below, beneath

යටගිය *ad.* anciently, formerly; past, gone

යටත් a. (යට *below* ත් *for* ගත් *who stays*) humble, obedient, submissive; mean, low, servile

යටත්පිරිසෙයින් *ad.* lowly, submissively, servilely

යටිලෑව s. beneath, a place below, the under part, underneath

යටලිය s. (යට *and* ලිය *a staff &c.*) a beam, the under beam of a house upon which the rafters are nailed

යටි s. any creeping plant; a staff, a stick, the *Elu* form of යෂ්ටි, also written යැටි

යටිතුරං s. the the under part, underneath

යටිපතුල s. (යටි *and* පතුල *the sole of the foot*) the sole of the foot

යනොහොත් *ind.* a particle equivalent to if, if so, that is to say viz. &c.

යති s. (යම *to restrain or* යත *to endeavour* ඉන් *aff.*) an ascetic, one whose passions are completely under subjection; a religious mendicant; *a buddhist* ascetic, a priest, *a rahatun;* restraining, controuling; stopping, ceasing, rest, term; a pause in poetry or metre; a stop, a rest

යතින් see the last

යතීන්ද්‍ර s. (යති *an ascetic, a priest* ඉන්ද්‍ර *a chief*) a chief or high priest; a tree (*viteria indica*)

යතු s. going, a journey; planing, smoothing

යතුකැටය s. a carpenter's plane

යතුගානවා v. to smooth, to plane

යතුතිරය s. the chisel or steel part of a plane

යතුර s. a key; a lock; a machine, an instrument in general, the *Elu* form of යන්ත්‍ර

යතුරු s. going, a journey, a voyage; a way, a road, a path, from යාත්‍රා

යතුරං see යතුර

යතුරංදුනා s. (යතුරං *and* දුන්නා *a bow*) the spring of a lock

යතුරංසර s. an elephant keeper; a path, a road, a frequented path

යත්න s. effort, exertion, perseverance, energy

යත්යත් s. passing, going, from time to time

යථා *ind.* as, according to, correlative to තථා so

යථාජාත a. (යථා *as* ජාත *born*) foolish, stupid, as simple as at birth; barbarous, outcast; naked

යථාණිත්ත *ad.* deeply, profoundly

යථානුරූප a. (යථා *as* අනුරූප *fit*) suitable, proper, consistent, fit

යථාපි *ad.* some how

යථාබල *ad.* powerfully, possibly, according to ability

යථාභූත *a.* (යථා *as* භූත *being*) exact, true, real state; like, resembling; so, in that manner

යථාවී *ad.* (යථා *as* අවී *properly*) properly, suitably

යථාවීවර්ණ *s.* (යථාවී *suitably* වර්ණ *colour*) a spy, a secret emissary

යථාශක්ති *ad.* (යථා *as* ශක්ති *strength*) extent of capability; as much as possible

යථාසන්ථිතිකාංග *s.* (යථා *as* සන්ථිත *spread* අංග *an ordinance*) an ordinance of the *buddhist* priesthood enjoining it upon the priests never to change or alter the mat or bed which they first spread out to repose upon, as it is first laid down so it must remain; see නෙ ලෙස්ධුතාංග

යථාස්වරූප *ad.* (යථා *as* ස්වරූප *form*) properly, consistently, according to form or nature

යදඬ *s.* (ය *iron* දඬ *a bar*) a bar or pig of iron

යදුම see the next

යදම *s.* an iron chain

යදි *ind.* particle of suspicion or doubt;—*s.* a beggar, a mendicant

යදිනවා *v.* to pray, to beseech, to entreat; to ask alms; to curse, to imprecate

යදිවා *ind.* then, now, if, therefore, see යදි

යන් see යම්

යන *a.* going, journeying; an affix, answering to that is, such as, as for instance

යනවා *v.* to go, to walk, to proceed, to journey

යනාදිය *ad.* and so forth, such like, etcetera

යනු *ind.* a continuative particle, corresponding to that is, that is to say, as the forementioned, &c.

යන්තම් *ad.* a little, somewhat

යන්නා *s.* a goer, a traveller, a journeyer

යන්තුරු see යන්ත්‍ර

යන්ත්‍ර *s.* a machine in general, any implement or apparatus; a diagram of a mystical nature or astrological character; a sort of vessel; controlling, checking, restraining; a charioteer, an elephant driver

යන්ත්‍රිත *a.* bound, tied; restrainted, checked

යපත *s.* (ය *iron* පත *a leaf*) a plate of iron, sheet iron

යපල *s.* a lie, an untruth, a falsehood

යපට *s.* a piece of iron, a pig of iron

යැපුම *s.* support, sustenance, livelihood, means of support

යැපෙන see the foregoing word

යම් a particle or prefix, signifying, some, any, it is variously written; as, ය•, යන් &c.

යම *s.* the regent of death and the final judge of the actions of men; he corresponds in many particulars with the *grecian* god *pluto*; and the judge of hell *minos*; he holds his court in *pátála* but decides only on doubtful characters; for according to the *buddhist* system, evil and virtue reward themselves, so that a decidedly vicious character at the hour of death goes direct to *narakádi*, and a virtuous one to *swarga*, without any reference to *yama*, his office being only to determine the fate of cases where both vice and virtue have prevailed; a name of the planet *saturn*; the performance

of religious rites for the purposes of purification, religious restraint; forbearence, restraint, cessation, stop, conclusion

යම්කි *adv.* something, any thing, ought

යමක *s.* a religious obligation or observance; alliteration; rhime; the repetition of similar sounds, either in the course of a sentence or line, or at the end of two corresponding stanzas; the repetition of a line; a pair; twins; one of a pair, a twin

යමකප්‍රාතිහාර්‍ය *s.* (යමක *two, a couple* ප්‍රාතිහාර්‍ය *a wonder, a feat*) a miracle performed by *buddha*, for the purpose of confounding the *nighantayás* or naked religious mendicants, and of exhibiting to them a proof that he possessed the power of performing supernatural acts; the miracle performed on this occasion consisted in his causing two streams one as of fire, and the other as of water, to issue at the same moment from his eyes, his ears, and his nostrils; this supernatural power was the result of his having performed the තේජෝ and ආපෝ කසිණ; see කසිණ

යමදූත *s.* (යම *yama* දූත *a messenger*) an infernal spirit; the messenger or minister of *yama*, employed to bring the souls of the dead to *yama's* judgment seat, and thence conduct them to their final destination

යමන *s.* a name of *yama*; binding, confining; term; cessation, rest; controlling, restrolling

යමපල්ලෝ *s.* one of *yama's* agents whose business is to inflict the punishments of hell; an infernal tormentor, a fury

යමප්‍රිය *s.* (යම *yama* ප්‍රිය *beloved*) indian fig tree *ficus indica*)

යමරථ *s.* (යම *yama* රථ *a car*) a buffalo

යමරජ the Eloo form of the following

යමරාජ *s.* (යම *yama* රාජ *ruler*) *yama*, the *indian pluto*, see යම·

යමරාජි as the foregoing

යමල *s.* a pair, a brace, a couple; a sort of dress, a body and petticoat; also a contraction of යකඩමල the rust of iron

යමලපුෂ්පක *s.* (යමල and පුෂ්ප *a flower*) a tree, mountain ebony (*bauhina purpurea*)

යමවාහන *s.* (යම *yama* වාහන *a vehicle*) a buffalo

යමාමහපෙළහැර see යමකප්‍රාති හාර්‍ය

යමුනා *s.* the *jumna* river which rises on the south side of the *himála* range, at a short distance to the North west of the source of the *ganges*, and which after a course of about 378 miles falls into that river immediately below *allahabad*; in *hindu* mythology the personified river is considered as the daughter of *swarga* and sister of *yama*

යමුනාපහ see the last

යමෙක් *pron.* any one, some one (used only of persons)

යමෙකු see the last

යම්කිසි *pron.* (යම් *any* කිසි *the same*) ought, any (thing) some what

යම්තාක් *ad.* so much, such a quantity &c.

යම්යම *ad.* any, ought, some

යම්හෙයකින් *ad.* in any way, in any manner, any wise

යයි *ind.* a continuative parti-

cle generally connecting two or more verbs, expressing different actions, but governed by the same nominative

යර a. constant, continual, uninterrupted, endless

යල ad. again, moreover, furthermore;—s. one of the singhalese harvests, the lesser one

යලිහි ad. again, moreover

යලි ad. again, furthermore

යව s. barley (*hordeum hexastichon*); water; a tree, (*bignonia indica*); speed, velocity; coriander

යවකාරළුණු see යවක්ෂාර

යවකාර see යවක්ෂාර

යවක්ෂාර s. (යව *barley* ක්ෂාර *ashes or salt*) salt petre, nitre, nitrate of potash, prepared from burnt barley, the potash being thus procured

යවක්ෂුක see යවශූක

යවගු see යවාගු

අරවරයා *s.* a quarrel some man

අරසර *s.* service, the *Elu* form of ආරවාර

අරහ *a.* just, proper, fit

අරිඅව see අෂ්වාසයි appendix

අරිසර *ind.* always, constantly, incessantly

අරිෂ්ටකම *s.* (අරිෂ්ට *disagreeable* කම *aff*) bitterness, wrath, malice

අරුත *s.* signification; wealth &c. see අර්ථ; aversion, see අරුචි

අරුණු see අරුණ

අරුණුවන් *s.* (අරුණු *and* වන් *colour*) the colour of the dawn, dark red

අරෙචක see අරුචි

අර්ත්ත see අරත්ත

අර්ජුනි *s.* a cow; grass; inflammation of the eyelids; a bawd

අර්ධාංශ *s.* (අර්ධ *a half* අංශ *part*) a quarter, one fourth

අර්පණ *s.* putting, fixing, placing

අර්හත් *s.* (අර්හ *to worship* ත් *aff.* or අරි *an enemy*, the passions, හත *destroyed*) an *arahat*, one who has completely destroyed *klésha* or passion, and is consequently prepared for *nirvána;* it is the first of the 9 pre-eminent qualities of *buddha*, see නවගුණ

අර්හත්මාර්ගය *s.* (අර්හත් *an arahat* මාර්ග *way, path*) the last of 4 paths or grades to *nirvána*, when the passions which are the source of existence being destroyed, the devotee attains *nirvána* or extinction

අලංසාටක *s.* (අලං *enough* සා ටක *dress*) a class of *brahmans* who are so voracious that they untie their girdles &c. previous to eating, in order to remove every impediment

අලක් *s.* painting, from ආලේඛන

අලකමඳ *s.* *kuvéra's* city

අලකිරිය *s.* a plant (*menispermum glabrum*)

අලතා *s.* *lac*, the animal dye, see අලක්ත

අලමඳ *s.* the city of *wæsamuni* or *kuvera*

අලව් *s.* work, service

අලවංල් *s.* the ratan?

අලාසි *s.* need, necessity

අලික් *s.* a picture, a painting, from ආලේඛන

අලික්කැමි *s.* (අලික් *and* කැමි *who does*) a painter

අලිඟ *s.* an embrace, embracing, from ආලිඟ

අළු *s.* dawn, morning; haste; a pitcher, a small water jar; a wood, a forest

අළුකොබෙයියා *s.* (අළු *a wood* කොබෙයියා *a pidgeon*) the wild or spotted necked pigeon

අළුත්වත *s.* (අළුත් *new* වත *a cloth*) new cloth

අළුප් *s.* (අ *neg.* ළුප් *cut*) not cut off, unchanged, as an affix &c; also a word, from ආලොප

අළුවා *s.* a sweetmeat, made of flour, *jaggery*, *ghee*, *&c.*

අලේන *a.* (අ *priv.* ලේන *refuge*) destitute, unprotected

අලොප් *s.* a ball of rice, see ආලොප

අවක්‍රය *s.* (අව *and* ක්‍රී *to buy* අ *aff.*) price

අවකෘෂ්ට *a.* (අව *priv.* කෘෂ්ට *drawn to*) understanding, comprehension

අවගාහ *s.* (අව *and* ගාහ *to agitate*) bathing, immersion

අවජල *s.* the 4th. day after new or full moon, reckoned unlucky

අවජාතය *s.* (අව *implying depreciation* ජාත *born*) a bastard, an adulterine

අවතොකා *s.* (අව *implying depreciation* තොක *offspring*) a cow miscarrying through accident

අවද *s.* thought, the *Elu* form of ආවජ්ජන

අවදිවෙනවා *v.* to awake

අවධාරණ *s.* (අව *and* ධර *to bear* අන *aff.*) a class of emphatic indeclinables; see also අවධි

අවන *s.* preserving, protecting; going; —*a.* bent

අවනාසත් *s.* (අවන *came*, from ආපන්න and සත් *a being*) a pregnant woman

අවනි *s.* the earth

අවනු *s.* platted cord

අවන්ර්ජ *s.* a name of *balaráma*

අවන්සත් see අවනාසත්

අවන්හල *s.* (අවන් *drinking together* හල *a house*) a tavern, a place where spirits are sold

අවම *a.* low, vile, inferior

අවමත *a.* (අව *implying contempt* මත *regarded*) contemned, despised

අවමන් see අවමාන්න

අවමද් *s.* devastation, laying waste a country

අවමස *s.* (අව *implying depreciation* මස *a month*) the dark fortnight

අවමාණිත see අවමත above

අවය the *Elu* form of අපාය

අවරජ *s.* (අවර *after* ජ *born* a younger brother

අවරියගස *s.* (අවරි *and* ගස *a tree*) a small plant (*nerium tinctorium*), a decoction of the leaves with the addition of a little lime juice makes an indigo of fine quality

අවල්කෙලි see අවල

අවලියම *s.* biting

අවශ්‍ය *a.* (අ *neg.* වශ *to subdue*) certainly, necessarily

අවස් see ආවාස

අවසන see අවසාන

අවසේ see අටවාව

අවා *s.* a house; see also අවාස appen.

අවාක් see the next

අවාචි *a.* (අව *down* අච් *to go*) down looking, headlong; south;—*s.* the south quarter, which is considered as below

අවාචිනි see the last

අවාන් *s.* danger

අවාහ *a.* (අ *neg.* වාහ *marriage*) unmaried, single

අවිඝන *a.* (අ *neg.* විඝන *impediment*) unobstructed; facile, easy

අවිච්චියා *s.* (අවිච්චි *an imitative sound* යා *aff.*) a small bird with a red breast, only appearing in October, the red breast?

අවිද්‍යාඝ *s.* (අවිද්‍ය *ignorance* අඝ *sin*) the consequences of ignorance, lust, passion &c.

අවිසිය *ind.* a particle implying intensity, very, exceeding, from අතිශය

අවිරා *s.* (අ *priv.* විර *strong*) a woman without either husband or children

අවුරා *s.* a rampart, an entrenchment, a breastwork, near the entrance of a city; also, mode, manner, from ආකාර

අවුරං see the last

අවුල *s.* cakes, sweetmeats

අවුළුපන see the last

අවුල්දති *s.* (අවුල *a thicket* දති *a tooth*) an alligator

අවුස් *s.* a drum in general

අශ්මන්ත *s.* (අශ්ම *a stone* අන්ත *end*) a fire place; death; a field, a plain

අශ්වටංක see අටහම්න

අෂ්ටවිද්‍යා *s.* (අෂ්ට *eight* විද්‍ය *knowledge*) eight branches of knowledge, peculiar to the *rahats*, viz. 1. knowledge attained by abstract meditation, 2. the power of doing any thing desired, 3. the ability to assume a variety of shapes, 4. supernatural hearing, 5. the knowledge of others heart, 6. a knowledge of former existence, 7. divine sight, 8. divine knowledge

අෂ්ටවිධපාන *s.* (අෂ්ට *eight* විධ *a sort* පාන *drink*) eight kinds of fruit, the juice of which diluted with water the priests are permitted to drink, viz. the mango, the jambu, the plantain, a seedy sort of plantain, the grape, a sort of lotus or water lily, the jujube, and *boraludamunu* a sort of *calyptranthes*?

අෂ්ටසමාපත්ති s. (අෂ්ට *eight* සමාපත්ති *an attainment*) eight religious observances practised by one of the religious sects, viz. that of *kapila*; as also by the *buddhists*, or the four *dhyánas* and the four duties of the *brahman*

අෂ්ටාභාමාශිකාය see අටභාමිනා

අෂ්ටාංගිකමාර්ගය s. (අෂ්ට *eight* අංග *a limb* ඉක *having* මාර්ග *a way*) the road to *nirvána*, consisting of 4 grades and their 4 attendant enjoyments

අෂ්ටාර්‍ය්‍ය s. (අෂ්ට *eight* ආර්‍ය්‍ය *venerable*) the 4 paths to *nirvána*, and their 4 consequent enjoyments

අෂ්ථිසංඛලිකා s. (අෂ්ථි *a bone* සංඛලිකා *a chain, a fetter*) a skeleton

අෂ්ඨීල s. a disease, described as tumours in the viscera, probably an enlargement of the mesentric glands

අශ්ව s. a horse; a seal, a signet; an angle, a corner; a bear; the half moon; the shoulder

අජ s. a goat &c. see the last

අසන් see the next

අසංකා s. (අ *neg.* සංකා *doubt*) certainty, assurance; see අශංකා

අසඤ්ඤතලය s. (අ *neg.* සඤ්ඤ *thought* තල *place, scite*) one of the 20 *brahma lokas*, in which there is mere form without intelligence, the mind being in a state of complete torpor; it is regarded as the reward of practising erroneous or heretical abstraction, and when the soul awakes it is again liable to transmigration

අසත්දම් see අසධම්

අසද්‍රිශ the *Elu* form of අසදෘශ

අසන් see ආසන්න

අසනි see අශනි

අසම්දිටු s. (අ *priv.* සම්දිටු *orthodoxy*) heterodoxy, holding false tenets

අසහ්‍ය a. (අ *neg.* සහ්‍ය *to be borne*) unbearable, insufferable

අසර s. an *apsara*, see අප්සර appendix

අසල s. a rock, a mountain, from අචල; shaking; vexing;—*a.* eternal

අසාතමෙත්‍රය s, (අ *neg,* සාත *pleasure* මෙත්‍ර *knowledge*) knowledge of the female character

අසිත් s. a surprizing act or event, a prodigy

අසිඩ a. (අ *neg.* සිඩ *perfect, complete*) unripe

අසිඩ්‍ය a. (අ *priv,* සිඩ්‍ය *what can occur*) impossible, impracticable

අසිරි s. surprize, from ආශ්චර්‍ය

අසිරිරූ s. (අසිරි *surprising* රූ *form, beauty*) a name of *káma* or *cupid*

අසිරුරු see the last

අසිවිස s. (අසි *a tooth or fang* විස *poison*) a snake, from ආශීවිෂ

අසුපවත s. a crop of grain, the harvest

අසුරභවන s. (අසුර *an asura* භවන *a habitation*) the residence or place of confinement allotted to the vanquished *titans*, after their conflict with the gods, situated beneath *méru*, and surrounded by the ocean, which prevents all egress; it is one of the four states of punitive infliction, see සතරඅපාය

අසුරගුරු s. (අසුර *an asura* ගුරු *a teacher*) *sukra* the regent of

*venus*, and preceptor of the titans

අසුරරජ *s.* (අසුර *and* රජ *king* or *to shine*) *wépachitti*, the chief of the *asuras*; also *sikura*, see the last

අසුරි *s.* black mustard (*sinapis ramosa*)

අසුවිඅස්ත්‍රාලක්ෂණ *s.* (අසුව *and* ව්‍යඤ්ජන *inherent* ලක්ෂණ *a mark*) the 80 minor tokens inherent in the person of *buddha*, and indicative of his character

අසෙනා *s.* forked lightning; also thunder

අසේ *s.* a female friend

අශෝ and අශෝක see අශෝක

අස්ඔබනවා *v.* (අස් *a seal* ඔබනවා *to press*) to seal, to stamp with a seal

අස්කඩ *s.* a breach or opening in a dam

අස්කරණවා *v.* to put in order, to arrange, to decorate

අස්හනවා *v.* to smooth, as timber, or the ground &c.

අස්තගම *s.* (අස්තම් *disappearance* ගම *to go*) descending, setting, going down; vanishing, disappearing

අස්තම් *ind.* (අස *to cast* තම් *aff.*) disappearing, vanishing; setting

අස්නා *s.* hunger

අස්බැවිල *s.* a plant, the jujube (*zizyphus jujube*)

අස්මුද්ද *s.* (අස් *and* මුද්ද *the same*) a seal, a signet

අස්රැපු *s.* (අස් *a horse* රැපු *an enemy*) a buffalo

අස්ලිසේ the *Elu* form of අශ්ලේෂ

අස්සකණ්ණ *s.* the 7th. or outermost of the circular ranges of rocks, surrounding *méru*, and forming the boundaries of as many circumambient waters or oceans

අස්සගාම *s.* (අස *a corner* ස *aff.* ගාම *going*) going aside or out of the way

අස්සෙස් *s.* comfort; see also ආස්වාස

අස්වාමික *a.* (අ *priv.* ස්වාමි *a husband* ක *aff.*) unmarried, not having a husband or master

අස්විදිය see අස්රැපු appendix

අස්වැන්න *s.* (අස් *a horse* වැන්න *resembling*) an annual plant (*hedysarum vaginale*), like a horse's tail; corn, grain

අස්ස *ind.* a corner, an angle

අස *s.* selvage of cloth: the top of a tree; see also අස appendix

අහස්තන් *s.* (අහස *the sky* තන් *a covering*, from ඡන්න) a canopy, an awning

අහිකුණ්ඩික see අහිතුණ්ඩික

අහිරි *a.* (අ *priv.* හිරි *shame*) bold, impudent

අහිවාතක *s.* (අහි *a snake* වාත *wind*, *breath* ක *aff.*) pestilence, plague

## ආ

ආකරණ *s.* explanation, gloss, commentary

ආකාරණ *s.* (ආ *prefixed to* කර *to do* අණ *aff.*) calling, call or summons

ආකාසානඤ්චායතන *s.* one of the *brahma lókas*, the 1st. of the 4 *arútalas*, or states of immaterial existence

ආකිඤ්චඤ්ඤායතන *s.* the 2d. of the four *arútalas*, see the last

ආකුඤ්චන *s.* (ආ *and* කුඤ්ච *to be crooked* අන *aff.*) bending, curving

ආඛ්‍යකරණ see ආඛ්‍යාකරණ

ආඝ *s.* sin, see ආඝාස

ආගන්තුක *a.* (ආ *and* ගම් *to go* තුක *aff.*) incidental, adventitious

ආගන්තුකජ්වර *s.* (ආගන්තුක *incidental* ක *aff.* ජ්වර *fever*) fever caused by an accident, as a fall, or the fracture of a limb &c.

ආගුචාරී *s.* (ආගස් *sin* චාරී *who walks in*) a sinner, a transgressor

ආච්ඡුරිකා see the next

ආච්ඡුරිත *s.* (ආ *and* ඡුර *to cut* ක්ත *aff.*) a horse laugh; making a noise with the finger nails by rubbing them on one another

ආජක *s.* cow's milk

ආජි *s.* (අජ *to go* ඉන් *aff.*) level ground

ආජූර් *s.* (ආ *and* ජූර් *to become old*) working without wages

ආජූ see the last

ආජ්‍ය *s.* *ghee* or oiled butter

ආවාප *s.* a potter's furnace

ආඩාතෝඩා *s.* a plant (*justicia adhenatoda*)

ආඩරූෂක *s.* a plant (*justicia adhenatoda*)

ආඪ්‍ය *a.* opulent, wealthy

ආණි *s.* the pin of the axle tree of a cart

ආති *s.* a bird

ආතුර *a.* (ආ *and* තුර *to hasten*) diseased

ආත්මඝෝෂ *s.* a crow; a cock

ආත්මභූ *s.* (ආත්ම *the soul* භූ *who is born*) a name of *káma* the god of love

ආත්මානුද්‍රෂ්ටිය *s.* (ආත්ම *self* අනුද්‍රෂ්ටිය *seeing*) experience

ආදහන *a.* (ආ *and* දහ *to burn*) burning, conflagration

ආධ්‍යාත්ම *s.* (අධි *and* අණ් *aff.* ආත්ම *self &c.*) the inner man, the soul or seat of intelligence

ආධ්‍යාත්මික *a.* internal, mental

ආද්‍යූන *a.* voracious, greedy

ආධි *s.* mental agony, anxiety

ආධිවේදන see the last

ආධ්‍යා see the next

ආධ්‍යාන *s.* (ආ *and* ධ්‍යෛ *to think* ල්‍යුට් *aff.*) remembering, recollecting, dwelling or meditating upon

ආධ්‍යාපක *s.* a teacher, a scriptural preceptor

ආධ්‍යාශ *s.* thought, reflection; intent, purpose

ආනද්ධ *s.* (ආ *and* නහ *to bind* ක්ත *aff.*) a drum in general; —*a.* tied, bound

ආනන්ද *s.* a fabulous fish, 4000 *yoduns* in length, see තිමිංගල

ආනඹ *s.* a sort of food

ආනර්ත *s.* (ආ *before* නෘත *to dance*) war; a stage, a theatre; a country on the north of the malabar coast

ආනාවක *s.* a herald, the bearer of royal edicts

ආනාය *s.* (ආ *prep.* ණී *to obtain*) a net

ආනාහ *s.* (ආ *before* නහ *to bind*) epistasis, suppression of urine, or constipation; swelling of the bowels with wind

ආනුත්තම *a.* eminent, high, exalted

ආන්දෝලිකා *s.* (ආන්දෝල *shaking* ඉක *aff.*) a sort of palanquin or *dooly*, a swinging litter

ආන්ධසික *s.* (අන්ධස් *boiled rice* ඉක *aff*) a cook

ආපක්ව *a.* (ආ *diminutive* පක්ව *dressed, cooked*) half baked grain &c. eaten from the hand

ආපගා *s.* (ආප *water* ගා *what goes*) a river, a stream.

ආපචිත *s.* offering, oblation
ආපස් *s.* water
ආපාක *s.* (ආ *and* පච් *to bake*) a potter's kiln
ආපාන *s.* (ආ *together* පාන *drinking*) a place for drinking in society
ආපීඩ *s.* (ආ *and* පීඩ *to afflict*) a chaplet tied on the top of the head
ආපොකසිණ *s.* (ආපස් *water* ක සිණ *kasina*) the power of producing the watery humour of the body in a sensible form from the mouth, eyes, &c. attained by *dhyána* or intense abstraction
ආපොධාතුව *s.* (ආපස් *water* ධා *an element*) water, as one of the premary eliments
ආප්තාහංකාර *a.* (ආප්ත *came* හ අංකාර *pride*) proud, haughty
ආප්තික *s.* (ආප්ති *gain* ක *aff.*) a merchant, a usurer
ආප්‍ය *a.* (ආප *water* ය *aff.*) watery, consisting of water, as froth; a plant, a kind of *costus*
ආම්වාතය *s.* (ආම *and* වාත *wind*) a morbid air producing slight diarrhœa)
ආමනස්‍ය *s.* (ආ *priv.* මනස් *the mind* ය *aff.*) pain
ආම්ලක *s.* a gem, crystal
ආම්නායය see ආම්නාය above
ආමිෂදාන *s.* (ආමිෂ *and* දාන *a gift*) bestowing flesh, alms &c.
ආමුක්ත *a.* (ආ *and* මුච් *to release, unbind* ක්ත *aff.*) clothed, accoutred
ආයති *s.* (ආ *and* යම් *to restrain*) future time; restraining; length
ආයත්ත *a.* (ආ *and* යම් *to refrain* ක්ත *aff.*) docile, tractable, dependant
ආයස් *s.* iron

ආයාන *s.* (ආ *and* යා *to obtain* අන *aff.*) the natural temperament or disposition
ආයොජන *s.* (ආ *and* යුජ් *to join*) preparation, provision
ආයොධන *s.* (ආ *and* යුධ් *to fight* අන *aff.*) war, battle
ආරණ්‍යකාංග *s.* (අරණ්‍ය *a forest* ක *aff.* අංග *an ordinance*) an institute of the *buddhist* priesthood, enjoining upon the priests to live in forests or solitary places and not in town or villages, see තෙලෙස් ධුතාංග
ආර *s.* a shoemaker's awl
ආරාචාර *s.* (ආරාත් *near* චාර *to go*) service, ministering
ආරාත් *ind.* near; far, distant
ආරාධනාව *s.* intreating, solicitation, request; gratifying
ආරාලික *s.* (ආරාල *crooked*, bending over the dishes ඉක *aff.*) a cook
ආරාවුල *s.* (ආර *and* අවුල *confusion*) a dispute, a quarrel
ආරොපිත *a.* deposited, intrusted; fixed, placed, literally or figuratively
ආරොහණ *s.* (ආ *and* රුහ *to ascend* අන *aff.*) a ladder, a stair case; rising, ascending
ආර්ද්‍රා *s.* (ආර්ද් *to go* රක් *aff.*) the 6th. *nakshatra* or lunar mansion
ආර්යරත්න *s.* (ආර්ය *venerable* රත්න *a gem*) a *rahat*, a saint
ආර්යාවර්තය *s.* (ආර්ය *venerable* ආවර්ත *abode*) the holy land of *jambudwipa*, the country extending from the eastern to the western sea, and bounded on the north and south by the *himálaya* and *vindhya* mountains

ආලකා *s.* the city of *wœsamuni* or *kuvéra*, chief of the *yakshas*, situated in the north
ආලකාමන්ද see the last
ආලම්බ *s.* (ආ *and* ලබ *to hang* අව *aff.*) a staff, a crutch
ආලම්භ *s.* (ආ *and* ලභ *to kill*) slaughter, killing
ආලවක *s.* a demon or *yaksha*, one of the *yaksha* chiefs under *kuvera*
ආලානා *s.* (ආලා *to tie* or *fasten* අන *aff.*) the post to which an elephant is tied; a fetter, a tie
ආලාප *s.* (ආ *and* ලප *to speak*) speaking to, addressing
ආලේඛන *s.* (ආ *and* ලිඛ *to write* අන *aff.*) painting
ආල්හක see ආළක
ආවාහ *s.* any vessel
ආවාර *s.* the near bank of a river
ආවිස් *ind.* manifest, evidently
ආශ්‍රය *s.* (ආ *and* ශ්‍රි *to serve*) asylum, shelter, refuge, protection
ආශ්‍රුත *a.* (ආ *and* ශ්‍රු *to hear* ත *aff.*) promised
ආශංකා *s.* doubt, uncertainty
ආසව *s.* rum, spirit distilled from sugar or molasses
ආසාදිත *a.* acquired, obtained
ආසාර *s.* (ආ *and* සෘ *to go*) a hard shower; spreading, dispersing
ආසුර *s.* an *asura*
ආස්ඵෝටන *s.* (ආ *and* ස්ඵුට *to blow* or *expand*) blowing, expanding
ආස්ඵෝටනී *s.* a gimlet, an auger
ආස්මි *s.* a sort of sweetmeat like a pancake, made of flour, oil, and *jaggery*
ආස්‍යශෝෂ *s.* (ආස්‍ය *the mouth* ශෝෂ *what dries*) a disease, dryness of the mouth and lips
ආස්වාද see ආස්මි above
ආහත *s.* (ආ *and* හන *to strike* ත *aff.*) a drum;—*a.* beaten, hurt; uttered falsely
ආහෙය *s.* (අහි *a snake* ය *aff.*) belonging or relating to a snake

ඉ

ඉංසපාස *s.* a large timber tree (*dalbergia sisu*)
ඉකිබිඳිනවා *s.* (ඉක්ක *hiccup* බිඳිනවා *to break*) to sob, to sigh
ඉකිලි see ඉකිලිය
ඉක්‍රුළු see ඉකිලිය
ඉක්ෂුරස *s.* sugar
ඉඟාල *s.* a live coal &c.
ඉඟිල් *s.* copulation;—*a.* soft, tender
ඉඟිලස් *s.* pride
ඉඟං *a.* locomotive, moveable
ඉඟිත *s.* (ඉඟි *to go* ත *aff.*) hint, sign, gesture
ඉඟුල් *s.* vermilion, see සිඟුල
ඉන්ද්‍රියාව *s.* the ball of the eye, from ඉන්ද්‍රිය
ඉඳු *s.* the planet mercury
ඉජා *s.* the earth
ඉජාසුත *s.* the planet *mars*
ඉට්මිතුර *s.* (ඉට *wished* මිතුර *a friend*) a chosen friend
ඉටනවා *v.* to determine, to purpose, to resolve
ඉට්ටික *s.* a tile
ඉඩා *s.* the wife of *buddha*; daughter of *ikshwáku*; the earth; a tubular vessel; the left nostril; the goddess of speech
ඉතිවුත්තක *s.* (ඉති *thus* වුත්ත *said* ක *aff.*) one of the nine divisions of sacred science, which belong to *buddhism*, and comprehends such *sútras* or works as are written in

the catechetical form, see නා වාභාෂාංශය

ඉතිහ see ඉතිහාස

ඉත්තක් *ind.* a little, a bit

ඉත්තෑවා *s.* the porcupine

ඉදු see හුදු

ඉදි *s.* hope; strength; vital power

ඉදින් *ind.* a particle of subjunction, if, then

ඉදිරි *ind.* before, in presence of; hereafter, future

ඉදිරිපසු *a.* (ඉදිරි *before* පසු *last*) confused, out of order, first last

ඉදිවැල *s.* (ඉද්ද *the spindle* වැල *a stick*) the distaff

ඉඳු see පාඳු

ඉඳුප් see ඉඳුවා

ඉධම *s.* (ඉන්ධ *to kindle* මක් *aff.*) fuel

ඉඳිර *s.* a bee

ඉඳුකිල *s.* the threshold, see ඉන්ද්‍රකීල

ඉඳුන් *s.* stumbling

ඉඳුල්වෙනවා *v.* to be polluted, to have contracted some impurity, and rendered unfit for use

ඉඳුගෙසන *s.* (ඉඳු *indra* ගෙසන *thunder*) thunder

ඉන්දීවර see ඉන්දීවර

ඉන්දීවරී *s.* a plant (*asparagus racemosus*)

ඉන්ද්‍රකාඩා *s.* a sort of reed (*saccharum spontaneum*) ?

ඉන්ද්‍රචාප *s.* (ඉන්ද්‍ර *indra* චාප *a bow*) the rain bow

ඉන්ද්‍රපුෂ්පා *s.* (ඉන්ද්‍ර *indra* පුෂ්ප *a flower*) a small plant, with a poisonous root (*gloriosa superba*).

ඉන්ද්‍රපුෂ්පී see the last

ඉන්ද්‍රයව *s.* (ඉන්ද්‍ර *and* යව *seed*) the seed of the (*nerium antedysentericum*), it is used in cases of diarrhea, dysentery, &c

ඉන්ද්‍රසුරස *s.* (ඉන්ද්‍ර *best* සු *good* රස *juice*) a shrub, the leaves of which are used in discutient applications (*vitex negundo*)

ඉන්ද්‍රාරිගුරු *s.* (ඉන්ද්‍රාරි *a titan* ගුරු *a teacher*) *sikura* regent of the planet *venus*

ඉන්ද්‍රියබොධනී *s.* (ඉන්ද්‍රිය *and* බෝධනී *what expands*) a plant (*illecebrum sessile*)

ඉන්ද්‍රියායතන *s.* (ඉන්ද්‍රිය *and* ආයතන *a mansion*) the body, the residence of the senses

ඉපනොල්ල *s.* the culm or stalk of grain, stubble

ඉපිරේණවා see ඉපිරෙනවා

ඉපුල *s.* a blue lotus (*nymphea cærulea*) also, උපුල

ඉඹුල්කිරිබත් *s.* (ඉඹුල් *and* කිරිබත *rice milk*) balls of rice milk in the shape of the silk cotton pod

ඉය see ගිය

ඉරත්තය *s.* an even number

ඉරම්මද *s* the flash of lightning, fire accompanying the fall of a thunderbolt

ඉරා *s.* a word; speech, the goddess of speech; ardent spirit; the earth; age, the period of life

ඉරිණ *s.* (ඍ *to go* ඉන් *aff.*) a desert and inhospitable region, salt or barren soil

ඉරිතු *s.* a season, see ඍතු

ඉරිමට්ටම *s.* (ඉර *a line* මට්ටම *a rule*) a carpenter's rule

ඉරුංගු also see ඉරිඟු

ඉසීව *s.* the zodiacal sign *pisces*

ඉර්ධිප්‍රභෙද *s.* (ඉර්ධි *and* ප්‍රභෙද *a division*) the power of assuming innumerable shapes, one of the අෂ්ටවිද්‍යා

ඉල් *s.* a palanquin, a litter; see ඉල්මස

ඉලමලේ s. a snare, a noose for catching birds &c.

ඉළු s. a forest

ඉළුක්කෝලය s. a dart, a javelin

ඉල්තාතා s. a father in law

ඉල්ළුම see ඉල්වීම

ඉල්වලා s. stars in orion's head

ඉවකොළි s. the lap

ඉවිල s. diligence, labour, exertion

ඉවිලි see the last

ඉෂීකා s. a painter's brush; a kind of reed (*saccharum spontaneum*)

ඉස s. a bear

ඉසිකා s. a painter's brush

ඉසු see ඉෂු

ඉස්පාසුව s. opportunity, leisure

ඉස්බුන් s. ease, repose

ඉස්විට s. a brother

ඉස්වැටිය s. (ඉස *the head* වැටි *what encompasses*) a turban

ඉස්සර *ind.* before, prior, previous

ඉස්සරහ *ind.* (ඉස්සර *and* හ *aff.*) before, in presence of

ඉහතු *ind.* (ඉහ *here* තු *aff.*) this world

ඉහි s. the heart, the thinking faculty

ඊ

ඊරිණ *a.* (ඉරිණ *and* අණ් *aff.*) desert; saline and barren

ඊසක s. the diagrams &c. of astrologers

ඊසධර s. one of the 7 mountains surrounding *maha méru*

ඊසමුලා s. a plant (*asparagus racemosa*)

ඊසමුලි see the last

ඊසා see ඊෂා

උ

උකට the *Elu* form of උත්කෘෂ්ට

උකටලි s. disgust, aversion; weariness, from උත්කණ්ඨ

උකස්තිබනවා v. to pledge, to lay down a stake

උකුවී s. indolence, listlessness.

උකුණිල්ල s. a hook or stick of *toddy* drawers to hang their vessels on

උකුසුවන් s. a name of *garuda*

උක්කෝටන s. (උත් *and* කුට *to be crooked*) deception, fraud; excision

උක්පැණි s. (උක් *and* පැණි *juice*) the juice of the sugar cane

උගුඩුවා s. a wild cat

උච්චටා s. pride, arrogance; a species of *cyperus*

උච්චඩ *a.* (උත් *implying excess* චඩ *to be angry* අ *aff.*) quick, expeditious

උච්ඡ්‍රිත *a.* high, tall; produced, born

උඩනු s. a wicked man, a wretch

උඩුනු *a.* high, lofty

උඩුප s. a raft, a float

උඩුම s. pride, haughtiness

උඩුබ see උඩුප

උඩුබැල්මෙන් *ind.* (උඩ *up* බැල්ම *looking*) with the face upwards, prone

උදුඹර see උදුම්බර

උඩූප see උඩුප

උතුරුකුරු see උත්තරකුරු

උතුරුනා s. (උතුර *the north* නා *lord*) a name of *kuvéra*

උතුරුපල් the *Elu* form of උත්තරඵල්ගුණී

උතුරුපුටුපේ the *Elu* form of උත්තරභාද්‍රපද

උතුරුසල see උත්තරෂාඪා

උත්කණ්ඨා *a.* (උත් *much* කඨ *to be sad*) regretting, missing any object

උත්කුට s. sleeping with the head erect

උත්කුණ s. (උත් *loud* කුණ *to call* අ *aff.*) a louse

උත්කොච s. (උත් *and* කුච *to be crooked*) a bribe

උත්ක්‍රම s. (උත් *priv.* ක්‍රම *to go in order*) irregularity; want of order, perversion

උත්තරකුරු s. (උත්තර *northern* කුරු *the northern part of the globe*) the country about the north pole

උත්තරංග s. (උත්තර *above* ග *what goes*) a wooden arch surmounting a door frame

උත්තරතර a. (උත්තර *and* තර *very*) very eminent

උත්තරඵල්ගුණී s. (උත්තර *subsequent* ඵල්ගුණ *an asterism*) the 12th. lunar mansion containing two stars figured by a bed

උත්තරභාද්‍රපද s. (උත්තර *subsequent* භාද්‍රපද *the constellation*) the 27th. lunar mansion, figured by a couch, and comprehending 2 stars, of which one is *a*, *andromede*

උත්තරීය s. an upper and outer garment

උත්ත්‍රාස s. (උත් *much* ත්‍රාස *fear*) fear, terror

උත්ථාන s. (උත් *and* ස්ථා *to be*) rising, getting up; effort, exertion

උත්ථිත a. (උත් *and* ස්ථා *to be* ක්ත *aff.*) born, produced; encreasing, advancing &c.

උත්පත s. falling, descending

උත්පාටන s. (උත් *and* පට *to go* ණිච *aff.*) eradicating, pulling up by the roots

උත්ඵුල්ල a. (උත් *and* ඵුල්ල *blown*) blown, expanded as a flower; sleeping supinely

උත්භව see උද්භව

උත්‍රස්ත a. afraid, alarmed

උත්ලෙස s. a bribe

උත්සූර s. (උත් *up or priv.* සූර *the sun*) the rising of the sun; also, sunset, evening, twilight

උත්සෘෂ්ට a. (උත් *and* සෘජ *to leave* ක්ත *aff.*) left, abandoned

උදච් a. (උද් *up* අච් *to go*) north, northern; upper, upwards; subsequent, posterior

උදන්වත් and උදන්වා s. (උද *water* මතුප් *poss. aff.*) the ocean

උදධි s. the sea

උදය් s. height

උදාන s. one of the 9 classes of books into which the sacred writings of the buddhists are divided, such as are written in *Pali* stanza with a prose, *Páli* comment; joy, pleasure

උදාපවි see උදයග

උදාවෙනවා v. to arise, to ascend

උදාසන s. (උදය *morning* සන *time*) the morning, dawn

උදාසීන s. a stranger, a common acquaintance, a person neither friend nor foe

උදිච s. the north, see උදච්

උදිචන a. northern

උදු a. straight, the *Elu* form of ඍජු

උදුම්මනවා v. to puff up, to blow out

උදුඛල s. (උද් *up* ඛල *what goes*) a wooden mortar used for cleaning rice; a gum resin, bdellium

උදෙසනවා v. to enunciate, to say or declare

උද්ගාර s. (උද් *up* ගෘ *to vomit*) vomiting; sound

උද්ඝස s. flesh

උද්ඝාත s. a beginning, a thing begun; a chapter, a section of a book; a club, a mallet

උද්භින්න *a.* manifest, evident see උද්භේද

උද්භව *s.* (උද් *up* භූ *to be*) birth, production

උද්භිද් *a.* (උද් *up* භිද් *to break or burst*) sprouting, germinating

උද්භිදං *s.* culinary salt; also borax?

උබව *s.* pride, arrogance

උබෙග *s.* (උද් *up* විජ් *to fear, to shake &c.*) the fruit of the *areca catechu*, the betel nut; regret; fear ascending, mounting; one going swiftly, a runner, a courier

උනාමකුළු see මකුළු

උනම්බර *s.* (ඌන *deficient* අම්බර *clothing*) a naked ascetic

උනු *s.* an earring; decrease

උදුම්බ see උදු

උන්නිද්‍රතා *s.* (උන් *priv.* නිද්‍රා *sleep* තා *aff. ab.*) sleeplessness, see also උන්නිද්‍ර

උපකූජන *s.* (උප *and* කූජ් *to sound* ල්‍යුට) inarticulate sound as the cry of birds &c.

උපකූජිත see the last

උපග්‍රාහ්‍ය *s.* a present, an offering to a king or great man

උපඝාත *s.* disease; touch, contact with an intent to injure

උපඝ්න *s.* (උප *and* හන *to kill*) *&c.*) contiguous support

උපචරිත *a* served, ministered to

උපච්ඡින්න *a.* cut off, destroyed, lost

උපජාප *s.* dissension, division

උපජිව්හ *s* (උප *likeness* or *privation* ජිව්හ *a tongue*) the uvula or soft palate; a kind of insect; a disease, enlargement of the uvula?

උපත් *s.* birth, see උත්පත්ති

උපති *s.* contemptuous or derisive speech

උපදන් *s.* a pillow, from උපධාන

උපදන් *s.* a kind of cake

උපදින් *s.* birth, production

උපදෙශ් *s.* cunning, deceit, stratagem

උපනිෂණ්ණ *a.* sat, seated

උපරිෂ්ටා *ind.* up, above

උපලක්ෂිත *a.* (උප *near* ලක්ෂ *a mark* ඉත *having*) endued with, contained or inherent

උපලිප්ත *a.* (උප *and* ලිප *to smear* ක්ත *aff.*) smeared, daubed, anointed

උපසංහරණ see the next

උපහරණ *s.* illustration, see උදාහරණ

උපහාර *s.* a complimentary gift, a present to a superior

උපාලි *s.* the compiler and arranger of the *winaya*, or the sacred code of the *buddhist* priesthood

උපාහිත *s.* (උප *and* ආ *before* ධා *to hold* ක්ත *aff.*) a fiery portent, a meteor, a comet;—*a.* joined, anexed; deposited, entrusted

උපුල *s.* a stone

උපුල්කොල *s.* a drug (*costus speciosus*)?

උමන්ලිය *s.* a rafter

උම්දෙවි see උමා

උමුවු *s.* the chameleon

උමුතු see උන්මද්

උමුතුමන් *s.* the peacock

උමුව *ind.* before, in presence of; a sort of lizard

උයි *pron.* she

උයොජන *s.* preparation, provision, for a journey &c,

උරතුඩ *s.* the tip of the shoulder

උරචක්‍රමාලා *s.* (උර *the neck* චක්‍ර *a discus* මාලා *a garland*) a discus worn as a punishment in one of the infernal regions, which appears to the victim like a splendid necklace, but when he has put it on it cuts

him to pieces by its circular motion

උරණ *s.* anger, wrath

උරගත් *s.* (උර *belly* ගත් *what goes*) a snake

උරබාහුව *s.* (උර *the breast* බාහුව *the arm*) a disease in the arm and shoulder, rheumatism

උරරීකෘත *a.* (උරරී *implying assent &c.* කෘත *done*) promised; spread, diffused

උරරිපු *s.* (උර *a snake* රිපු *an enemy*) *garuda*, the bird of *vishnu*

උරසද see the next

උරශ්ඡද *s.* (උරශ් *the breast* ඡද *what covers*) armour, mail

උරසත්‍රාණ *s.* (උරස් *the breast* ත්‍රාණ *what preserves*) mail, the breast plate, or cuirass

උරසර *s.* (උර *a snake* සර *necklace*) a name of *iswara*

උරශිරස *s.* (උර *the shoulder* ශිරස *head*) the shoulder point

උරීරපාන see හුරීරපාන

උරීකෘත *a.* (උරී *implying certainty* කෘත *done*) promised, engaged, agreed

ඌරු *s.* the thigh

උරුණු see වුරුණු

උරුමුක see උරුමුක

උරුලෙවිවම *s.* musk, procured from the musk rat

උලක්කුව *ind.* little, small quantity

උලරු *a.* large, great, from උ ලාර

උළිඹ *s.* (ඉඳිපෙනවා *to spring* out of the water) an alligator

උළුවඩුවා *s.* (උළු *tiles* වඩුවා *a workman*) a bricklayer, or mason

උළුවහන *s.* (උළු *and* වහන *covering*) a roof

උළුවහල් see the next

උළුවා *s.* a small grain or seed used in condiments

උල්කා *s.* (උෂ *to burn* ල sub. for ෂ *and* ක *aff.*) a firebrand; a meteor, a flame

උල්බ see උල්ව

උල්ලංඝ *s.* (උද් *up* or *beyond* ලංඝ *to go*) going beyond, transgressing; leaping, bounding or springing over

උල්ලිප්ත *a.* smeared, anointed

උල්ව *s.* (උව *to accumulate* වන් *aff.*) the womb, the embryo

උල්වණ *a.* (උද් *up* ලවි *to join*) apparent, evident

උවට *s.* service, from උපස්ථ

උවතැඹ see උපස්ථම්භ

උවම see උපමාව

උවස *s.* affection, regard,

උවිඳුපුත *s.* (උවිඳු *vishnu* පුත් *son*) a name of *ananga*

උසබ *a.* in composition best, excellent, from ඍෂභ

උසා *s.* labour, exertion, from උත්සාහ; see also උෂ

උසි *s.* inciting, urging, as dogs &c. to the chase

උසිත් *s.* labour, endeavour, exertion

උස්ණ see උෂ්ණ

උසු *s.* a ray of light

---

ඌ

ඌරී *ind.* a particle of assent, and of expansion

ඌරු *a.* big, large

ඌරුබිම *s.* a salt pan

ඌරුමුව *s.* (ඌරු *large* මුව *mouth*) the owl

ඌර්ධ්වශ්වාස *s.* (ඌර්ධ්ව *up* ශ්වාස *breathing*) difficulty of breathing; also the rattling in the throat which precedes death

ඌර්ධ්ව see ඌර්ධ

ඌලුවා *s.* a fish, the dace?

ඌෂ්ණවාතය *s.* gonorrhea

ඌෂ්ණාංශු *s.* (ඌෂ්ණ *hot* අංශු *a ray*) the sun

## ඌ

ඌටූක *s.* teal
ඌහිකා *s.* censure, reproach
ඌතුපුෂ්ප *s.* a sort of collyrium
ඌතුට්ටාර *s.* a sort of potherb (*marsilia dentata*)
ඌෂ්ඩි *s.* the screw pine
ඌෂ්ෂක see ඌෂ්ෂා
ඌෂ්ෂප්‍රොක්ත *s.* a leguminous shrub (*glycine debilis*)

## එ

එකත් *ind.* (එක *one* අත් *side*) on one side
එකත්පස *s.* (එකත් *and* පස *a side*) on one side, aside
එකනින්නාද *s.* (එක *one* නින් නාද *loud noise*) a blast
එකප්පමණ *s.* (එක *one* පමණ *size*) of the same size &c, equal
එකමිතු *a.* (එක *and* මිතු *a friend*) friendly, united
එකස් *a.* (එක *one* අස *a corner* or *shoulder*) on one side, over one shoulder &c.
එකස්බෙර *s.* (එකස් *one ended* බෙර *a drum*) a timbrel, a tympanum
එකුරුංතුපට *s.* (එකුරුංතු *and* පට *a fold*) the end of the cloth folded and fasten at the waist, as a pocket &c.
එක්කුරුංචි *s.* a weight, and coin
එක්තල *s.* a drum beaten only on one end; harmony, unison
එක්සත් *s.* (එක *one* සත් *an umbrella*) universal rule or government
එතෙක් *ind.* until &c.
එන්සාල් *s.* small cardamums
එබි see හෙබි
එරබදු *s.* the coral tree (*erythrina indica*)
එරෝෂිය *s.* anger, wrath
එලබිල *s.* *wæsamuni*, or *kuvéra* from ඓලවිල
එලළු *a.* light red
එලවරා see හෙලවරා
එලමුරු *s.* (එල *white* මු *aff.* රු *red*) light red, pink
එලගවස *s.* a cow, milch cattle
එළිළි *a.* light red, copper coloured
එළුරුස *s.* (එළුව *a goat* රුස *sign*) the sign *aries*
එළුව see හෙළුවස
එසවීම *v. noun* of ඔසවනවා

## ඒ

ඒකාංස *s.* (ඒක *one* අංස *shoulder*) having over one shoulder
ඒකතාල *s.* harmony, unison
ඒකදන්ත *s.* (ඒක *one* දන්ත *a tooth*) a name of *ganésa*, who lost one of his tusks in a scuffle with *kártikéya*
ඒකපදී *s.* (ඒක *one* පද *a foot* ඊ *fem. aff.*) a road, a path
ඒකාකින් *a.* solitary, alone
ඒකාග්‍ර see ඒකාග්‍ර
ඒකාබ්ධ *s.* (ඒක *one* අබ්ධ *a year*) a heifer one year old
ඒකායනක see ඒකායන
ඒකාසනිකාඞ්ග *s.* (ඒක *one* ආසන *a seat* ඉක *aff.* අඞ්ග *an ordinance*) an institute of the *buddhist* code, enjoining upon the priests always to use the same seat while eating, see තෙලෙස්ධුතාඞ්ග
ඒඩ *a.* deaf
ඒඩමූක *a.* (ඒඩ *deaf* මූක *dumb*) deaf and dumb; wicked, perverse
ඒණ *s.* (ඉණ *to go* ණ *aff.*) a sort of deer or antelope, described as being of a black

colour, with beautiful eyes, and short legs
ඒණක see the last
ඒණේයාසක s. (ඒණ an antelope එය and ක aff.) a capital punishment, peeling the skin off from the cap of the knee to the neck, like the streaks of the antelope
ඒත s. a deer or antelope; a variegated colour; — a. arrived, come
ඒත a. of a variegated colour
ඒදනවා v. to prepare or mix a *curry*, or condiment &c.
ඒධ s. (ඒධ *to increase*) fuel, as wood, grass, &c.
ඒධිතා a. increased, grown
ඒනා s. sin; see ඒණ above
ඒණි see ඒණ above
ඒරකාවර්තික s. a capital punishment, stripping the skin from the neck to the waist, and folding it as a cloth
ඒරිත a. sent, dismissed
ඒලවාලුක s. (ඒලා *cardamums* වල *to breathe* ක *aff.*) a granular substance apparently vegetable, of a reddish brown color, and used as a drug and perfume
ඒලා s. small cardamums (*eletteria cardamomum*)

## ඓ

ඓණේය s. (ඒණ *an antelope* එය *aff.*) relating to an antelope
ඓරාවතී s. lightning, see ඓරාවත

## ඔ

ඔකද a. thick, coagulated; — s. a stream or pillar of light
ඔඝ see ඔක
ඔට s. the lip, from ඔෂ්ඨ; regard, affection
ඔට්ටු s. a pledge, a stake
ඔඩම s. a drinking vessel
ඔඩි s. a banner, a standard
ඔඩිසර්වචන s. irony, covert praise or censure
ඔඩ්ඩි see ඔඩු appendix
ඔත s. a falsehood, an untruth
ඔතනවා v. to fold, to lap, to wrap round
ඔතැකි a. weak, feeble, emaciated
ඔබල see ඔබලන්
ඔබමොබ ind. (ඔබ *there* මොබ *here*) here and there, up and down
ඔලගම s. place of refuge or concealment, from enemies or disease
ඔලගුව see ඔලොගුව
ඔලර a. great, large
ඔලාරි see the last
ඔළු s. a sort of white lily
ඔවජ s. a beam, a ray
ඔවස s. a house, a residence, from ආවාස
ඔවිල්ල s. a palanquin
ඔසතා s. perfumes, unguents
ඔසංගාට්ටුව s. a person who deals in perfumes, a perfumer
ඔසධිය s. a drug, brought from the *himálaya*, see ඖෂධය
ඔස්සෙ ind. along

## ඕ

ඕකද s. the shore or level ground along the banks of a river
ඕකස් s. an asylum, a place of refuge; a house
ඕඝා see ඕඝ
ඕජසඵුරණ s. (ඕජස් *and* සඵුරණ *emitting*) emitting light, shining
ඕඩු s. the name of a country the northern part of *orissa*
ඕදන s. (උන්ද *to be wet* ණ *aff.*) boiled rice

ඕභාස s. (අව and භාස shining) light, splendour, effulgence

ඖ

ඖදරික a. (උදර the belly ඉක aff.) selfishly voracious
ඖදුඹර see උදුඹර
ඖරභක s. (උරභ a sheep ක aff.) a flock of sheep
ඖර්ව s. (උර්ව a saint so called අණ් aff. of relation) submarine fire; alluding to the fable that a being of flame sprung from the thighs of the saint, and was received by the ocean
ඖපුකාස a. indolent, lazy

ඇ

ඇක s. the side
ඇකිල්ල see සැකිල්ල
ඇක්නුම් s. curse, imprecation
ඇගිලි s. a ditch, a gutter
ඇගෑ see අගස
ඇටමුල් s. (ඇට a bone මුල් root) the marrow of the bones
ඇට්ටරහස s. a variety of the sisu tree (*dalbergia sisu*)
ඇත් a. large
ඇත s. the hand and arm; an elephant
ඇතරු s. (ඇත and රු who mounts) an elephant driver
ඇතිකලවණ s. a garden, a park or pleasure ground
ඇතිනි see ඇතින්නි
ඇතුල්පුර see අන්තඃපුර
ඇත්කටු s. (ඇතා an elephant කටු a prick) an elephant hook
ඇත්කන් see හස්තිකර්ණ
ඇත්මද s. a tree (*echites scholaris*)
ඇත්වරණ s. (ඇතා an elephant වරණ stopping) an elephant hook
ඇද s. breath
ඇදි s. (අද to eat) eating
ඇදිල් s. the sun
ඇදුම s. difficulty of breathing; also, the rattling in the throat as a precursor of death
ඇදුරු *the Elu* form of ආචාරීන් of අදු and of ආදර
ඇනාවරණ a. opened, exposed, from අනාවරණ
ඇදිනාගන්නාවා see ඇදිනානාවා
ඇන්නෑරු *ind.* mishap, misfortune, an expression of anger or sorrow
ඇපි *ind.* we; see also අල්ප
ඇම් s. love, affection
ඇමිනෙනාවා v. to seize a bait, to get fast or entangled
ඇඹිවිල s. a species of rat
ඇඹිලි s. an oyster
ඇඹුල s. sourness, from ආම්ල; *emblic myrobalan*, from අම්ලක; the white water lily
ඇඹුල්පලා s. a *curry*, made of vegetables and lime juice only
ඇම්ම s. ache, pain
ඇය a. old, ancient
ඇයුම් v. *noun* of අයනාවා
ඇරදුනා see අජීර්ණ
ඇරයුම් s. prayer, request
ඇරිවුන් s. request
ඇලදුන් s. cold
ඇලය s. the side of the body
ඇලවුන් s. conversation, from ආලපනා; the pillar to which an elephant is tied
ඇලි s. wish, desire
ඇලිමුගටියා s. a sort of white *mungoose*
ඇලිය s. a gutter, a ditch
ඇලිසෙමර s. (ඇලි *white* සෙමර *a whisk*) a white *chámara* or whisk made from the tail of the *bos grunniens*
ඇලුප s. speech from ආලප
ඇලුම s. desire, longing
ඇල්කසඹිලිය s. a sort of white *kusambiliya* or *acalypha*?

ඇල්කිබො *s.* a small louse
ඇල්කිලෙනවා *v.* to separate a cow and calf from the flock
ඇවිත see ඇවිත්තී
ඇවෙටම *ind.* all, the whole
ඇවිදිළ *s.* the wall of a house
ඇස *s.* a corner, angle, from අශ්‍ර ; also breath
ඇස *s.* a tear, from අශ්‍රු ; see the last
ඇසිඞිකි *s,* the pupil of the eye
ඇසුරු *a.* joined, connected, from ආශ්‍රය
ඇස්දැල් *s.* (ඇස *an eye* දැල *a net, a multitude*) a name of *indra;* having interstices, coarse
ඇස්පත් *s.* a joint, a moveable fastening, a link, a hinge
ඇස්පිල් *s.* (ඇස *an eye* පිල *a feather*) a peacock's tail
ඇස්පිහාටුව *s.* (ඇස *an eye* පිහාටුව *a wing*) an eyelash
ඇස්මුඬු *s.* a lamp
ඇස්වටය *s.* the ancle bone
ඇසැල්ල *s.* joy, gladness
ඈ *ind.* etcetera, the *Elu* form of ආදී
ඈකන්කාව *s.* induration of the glands of the cheek
ඈය *s.* the pangolin

ක

කංකාල *s.* the skeleton
කකාරකිවා *v.* to make an infusion or decoction, by boiling &c.
කකුභ *s.* space, region, quarter as east, west, &c.
කකුල්දඩ *s.* (කකුල *the leg* දඩ *much*) continual moving, perpetual motion; wandering, vagrancy
කගවිසන් *s.* the rhinoceros
කටමිණ *s.* *vishnu's* jewel
කටරොළු *s.* a plant (*duria zerethinus*)
කටා *s.* an elephant's cheek or temple
කටුකරොහිණී *s.* a medicinal plant, used as a sedative and laxative
කටුකැල *s.* a tree (*butea frondosa*)
කටුපිලිකා *s.* an indurated ulcer arising from a wound
කටුමැටි *s.* the first clay coating of a wall
කටුසරණොස් *s.* several sorts of small grain or pulse
කටුසෙවෙල *s.* a plant (*draxantium spinosum*)
කටුසැමිටිය *s.* (කටු *a thorn* සැමිටි *a whip*) a scourge
කඩ *s.* (*from* ඛඩ) a piece, a part, a fragment; the half moon; an arrow; a shop, a *bazar;* a rag, bit of cloth
කඩලේන *s.* (කඩ *a rag* ලේන *heat*) a vessel in which medicine is boiled
කඩකපනවා *v.* to cut in pieces, to chip
කඩතුරු *s.* a veil, a curtain
කඩඳ *s.* the half moon
කඩමාල්ල *s.* a rag, ragged or patched cloth
කඩය *s.* a shop, an elevated place, or terrace in front of a house, where articles are exposed for sale
කඩවර *s.* a channel, a dyke, a gutter
කඩවසම *s.* sketch, lineament, outline
කඩාර *s.* a variegated colour, a mixture of blue and yellow
කඩුකාරයා *s.* a swordsman, a soldier armed with a sword
කඩුප්පුව *s.* a drumstick

කණ්ඩ *s.* sign, mark
කතරගම *s.* (කතර *a desert* ගම *a village*) a village in the S. East of Ceylon, celebrated for a temple of *kartikéya*
කතරගම්දෙවි ා *s.* (කතරගම *and* දෙවි ා *a god*) a name of *kartikéya* the god of war, by which he is generally designated in Ceylon
කතුරසැටි *s.* (කතුර *and* සැටි *a pole*) a walking stick
කතුරං *s.* a snake catcher
කතුස්ම see කත්හුස්ම
කත්නර් see කැත්තර appendix
කත්වංල *s.* (කද *an elastic stick* වංල *a cord*) a trap
කත්හුස්ම *s.* (කද *a porter's load* හුස්ම *breathing*) the distance at which a *cooly* or carrier usually rests, generally reckoned 1 mile English
කදන් *s.* mud; from කදීම
කණ් *s.* the eye
කණකොකා *s.* the stork
කණාත්ත *s.* a field
කණාදෙ *s.* lightning
කණාමැදිරය see කණාමැදිරියා
කදදෙස් *s.* the withers of an elephant
කදමල *s.* (කද *the trunk* මල *a flower*) a tree, producing a very fragrant flower from its trunk (*horsfieldia odorata*)
කදුල *s.* a drop
කණුපිස *s.* the flesh round the nails
කන්කාරිය *s.* (කණ් *and* කාරිය *business*) the invocation of devils &c.
කන්කුඩා *s.* an insect resembling the centipede
කන්ගංටිය *s.* (කණ *the ear* ගංට *a knot*) the lobe of the ear
කන්ධර *s.* (ක *water* or *the head* ධර *what supports*) a cloud; the neck
කන්පොත්ත *s.* (කණ *the ear* පොත්ත *bark*) the ear, reckoned an excrescence
කන්ඕසා *s.* a small red insect or worm, which causes death by entering the ear
කන්සිල *s.* the auditory passage
කපත් *s.* a crab
කපල්දර *s.* (කපල *a scull* දර *who has*) a name of *siva*, who wears a necklace of sculls; a beggar
කපිණී *s.* a female monkey
කප්සෙල see කල්පාන්නය
කප්සිටුවනවා *v* (කප් *a pillar* සිටුවනවා or සිටුවනවා *to fix*) to worship *pattini* &c. in which a pillar is set up, and the votaries cirumambulate it muttering invocations, beating drums &c.
කබරගා *s.* the ounce or panther
කබොල්ල *s.* the dry incrustation of a sore
කමඬා *s.* an ascetic's bowl or ewer
කමත *s.* a threshing floor
කමලපතු *s.* a plant bearing black blossoms (*xanthocymus pictorius*), from තමාලපතු
කමල්පත් see the last
කමා *s.* a woman
කම්බ see කල්මාෂ
කම්සි *s.* delay, loitering
කඹුව *s.* *areca catechu*, from කුඹුක
කඹිපිල් *s.* a peacock
කඹිය *s.* a rope
කඹුරනවා *v.* to serve as a menial or slave
කඹුරා *s.* a brazier, from කර්මාර
කබුරං *a.* variegated, from කබර
කඹුරංසම *s.* (කඹුරා *a smith* සම *a hide*) a bellows

කම්මල්හල s. a smith's shop, a smithery

කාමරිපු s. (කාම *káma* රිපු *an enemy*) a name of *siva*

කංසතාලම s. a cymbal

කරකරබැඳීම s. (කර *hand* කර *the same* බැඳීම *tying*) marriage

කරතල s. the palm of the hand

කරදිය s. salt water

කරත්ත s. a basket for fishing with

කරපුට s. (කර *the hand* පුට *a cavity*) the hands joined as if to receive water &c.

කරවිලි s. a sort of nightshade (*solanum sodomeum*)

කරරශ්ම s. (කර *strong* රශ්ම *a ray*) the sun

කරළ s. new cloth

කරවීක s. the *kokila*, or *indian* cuckoo

කරාකපුටා s. (කරවා *a fisherman* කපුටා *a crow*) crows frequenting the sea shore

කරීෂ s. the uterus; dry cow dung

කරහගානවා v. (කරහ *a harrow* ගානවා *to rub*) to harrow

කරුණ s. an event, see කාරණ

කර්ණනාද s. (කර්ණ *and* නාද *sound*) a disease of the ear

කර්ණමුඛ s. one of the 7 lakes in the *himálaya*

කර්තරී s. (කෘත *to cut*) a pair of scissors

කර්තිරි see the last

කර්පාස s. the rock rose (*cistus lobatus*)

කර්මක්ෂය s. (කර්ම *merit* ක්ෂය *consumption*) expenditure of desert

කර්මඵල s. (කර්ම *work* ඵල *aff. the produce of work*) wages, hire

කලකිරි s. death, dying

කලකිරිලි s. anger, wrath

කලකොළ s. war, battle

කලගුණ s. (කල *done* ගුණ *virtue*) a favour

කලගුණදන්නා s. (කලගුණ *and* දන්නා *who knows*) a grateful man

කලදුකා s. a squirrel

කලප s. a multitude, see කලාප

කලබ s. (කල *black* අබ *a cloud*) a rainy cloud

කලබා see කලභ

කලම s. a peacock's tail

කලල්ගැඩිම s. bubo

කලහංස s. a tree (*buchanania latifolia*)

කලහංස s. (කල *black* හංස *a goose*) a goose with black feet and bill

කලංගය s. a bag or basket made of the leaf of the areca tree

කලාදුරු s. the wax of the ear; a sort of fly

කලාශිල්ප s any mechanical art or profession

කලි *ind.* an expletive particle

කලි s dance, pantomime

කළු s. *krishna*;—*a.* pleasing, agreeable; black &c.; see කෘෂ්ණ

කළුඉංගිරියාව s. the pupil of the eye

කළුකද s. the *timbiri* tree (*embryapteris glutinifera*)

කළුකපා s. a tree (*nyctanthes arbor tristis*)

කළුකිඹිරි s. (කළු *black* තිඹිරි *timbiri*) a tree (*diospyros melanoxylon*)

කළුදුරු s (කළු *black* දුරු *cumin*) a plant (*nigella indica*)

කළුනික s. a tree a sort of *vitex*

කළුමදිනවා v. to black an *ola* manuscript

කළුමුව s. (කළු *black* මුව *mouth*) a monkey

කළුරත s. (කළු *black* රත *red*) dark red, purple
කළුවාල s. a tuberous plant, a kind of turmeric
කළුවෙළු s. venom, poison
කළුවැල s. an odoriferous creeper
කළුහිස්වලසා s. (කළු *black* හිස *head* වලසා *a bear*) the hyena
කල්ක s. a levigated powder
කල්‍යාණ s. (කල්‍ය *healthy* අන *to be*) good fortune, happiness, prosperity; beauty, a mark of beauty;—*a.* happy, well, righ
කල්හර see කල්හාර
කවච s. armor, mail
කවුඩුපනික්කියා s. (කවුඩු *a crow* පනික්කියා *master*) a small bird remarkable for its enmity to the crow
කවිදනා s. (කවි *a poem* දනා *a man*) a poet
කවෙළු s. a plant, see කාකොළි
කසිණ see පරිකසිණ
කසට *a.* astringent, harsh
කසවර්ණය s. yellow, saffron color
කසාවස්ත්‍ර s. the yellow robe of the *buddhist* priest
කසිණ s. all, whole, entire; see පරිකසිණ
කහයකඩි s. the tender kernel of the cocoanut
කහාපණ see කාර්ෂාපණ appendix
කහාපණදණ්ඩ s. a capital punishment, inflicted on malefactors
කහබත් s. (කහ *yellow* බත් *boiled rice*) rice boiled with a small quantity of turmeric
කාකභෝජක s. (කාක *a crow* අශ *who eats* ක *aff.*) a class of voracious *brahmans*
කාකස්වර s. (කාක *a crow* ස්වර *voice*) a hoarse or harsh voice
කාඩබාඩි s. a plant කාසිර
කාශ් *ind.* any one, some one
කාශ්නාංති s. (කාශ් *any one* නාංති *without*) friendless, destitute
කාත්‍යායන s. the name of a sage and grammarian
කාන s. a crow;—*a.* one eyed, monoculous
කාමතෘෂ්ණාව s. (කාම *lust* තෘෂ්ණා *the same*) lust, sensuality
කාමභව s. (කාම *passion* භව *being*) one of the three states of existence, that which includes men and gods
කාමවිකාර s. (කාම *lust* කාවිර *gesture*) wanton gesture
කාමාසික s. (කාම *lust* අශ *to go* ඉක *aff.*) a lecher
කාමාවචර *a.* (කාම *lust* අවචර *going*) sensual, subject to passion
කාමාවචරදිව්‍යලෝක s. (කාමාවචර *and* දිව්‍යලෝක *heaven*) the highest or last of the heavens
කායබන්ධන s. (කාය *the body* බන්ධන *tying*) a girdle, a zone
කායම s. the dregs of an infusion; also, a broth or decoction of spices, as pepper &c.
කායලයා s. a vender of medicaments
කාරණවා *v.* to haw
කාරඬව s. (ඩකර *vallisneria* අණ් *aff. of relation*) a sort of duck
කාලමුඛ s. (කාල *black* මුඛ *mouth*) a monkey
කාලවශාපි *a.* constant, perpetual, eternal
කාලසිංහ s. (කාල *black* සිංහ *a lion*) a bear
කාවල් s. care, preservation
කාව්‍යකතෘ s. (කාව්‍ය *a poem* කතෘ *who makes*) a poet
කාෂ්ඨංකෂ s. (කාෂ්ඨ *wood*

තක්ෂ to cut or pare) a carpenter

කාසාර s. (කා water සෘ to go) a pond, a pool

කාසීස s. (කාස cough අශ to eat) green vitriol, green sulphate of iron

කාශ්මීර s. (කාශ්මීර cashmir අණ් aff.) a plant with a tuberous root, a sort of costus (costus speciosus); also, cashmir

කාශ්මීරජ s. (කාශ්මීර and ජ born) saffron; costus; see the last

කාශ්මීරජන්මන් see the last

කිංකිණිදැල see කිංකිණි

කිංකිරිදිය s. a spreading shrub (eclipta or verbesina prostrata)

කිඹියර s. a worker in straw or ratan

කිඹු see කුඹා

කිඹියර s. a conjuror, the Elu form of කුහකකාර

කිත් s. fame, see කීර්තිය

කිඳු s. pepper

කිණි s. the sun

කිණිත්ත s. a bunch, a cluster

කිඳනවා v. to sink

කිඳුරිඳු s. (කිඳුරා a demigod or satyr ඉඳු chief) kuvéra

කින්නාරම s. a large sort of viná or lute

කිමි s. a small monkey

කිම්පක් see the next

කිම්පාක s. (කිං depreciative පාක what ripens &c.) poisonous fruit commonly called the poisonous mango

කිඹිලි s. a kind of sprat (clupea cultrata)

කිඹුල්වන් s. the color tawny

කියළු s. publishing

කියා s. a bullock's hump

කිරාත s. a small plant (gentiana cherayta), or according to Mr. Moon (melia pumila)

කිරාතක see කිරාතතික්ත below

කිරාතජ s. sandal

කිරාතතික්ත s. (කිරාත and තික්ත bitter) a kind of gentian (gentiana cherayta) found in the woods

කිරිකැටෙළු s. the Elu form of ක්ෂීරකාකෝලි

කිරිකොටනවා v. to churn

කිරිමත්ගානවා v. to churn

කිරිමව් s. (කිරි milk මව් a mother) a foster mother

කිරිමැටි s. (කිරි milk මැටි clay) pipe clay

කිරිරුක s. a tree (mimusops kauki)

කිරිසිඳු s. (කිරි and සිඳු sea) the sea of milk

කිලිඤ්ජ s. a mat, a screen of grass, straw &c.

කිලිල් s. the edible part of the stem of the cocoanut tree, cocoanut cabbage

කිළුටු a. dirty, filthy, polluted, the Elu form of ක්ලිෂ්ට

කිවි s. speech, speaking

කිසපිටුකුස් s. a man living at another's expence

කිසුසු a. all, see පරිසමස්ත

කිසුඵ s. the body

කිහිරි s. a tree (mimosa catechu) from ඛදිර

කිංකිරිදිය see කංකිරිදිය appendix

කුංකුම s. saffron (crocus sativus)

කුකුළුවැල් s. a small species of ratan

කුකුල්පොර s. (කුකුළා a cock පොර battle) cock fighting

කුටිපුරුෂ s. (කුටි a house පුරුෂ a man) the head of a family, a husband

කුටිල a. (කුට් to be crooked ඉල aff.) curved, bent

කුඩුගානවා v. to grater, to reduce to powder

කුඩුපුව s. food or cake made of the refuse of grain

කුණාල *s.* one of the 7 lakes in the *himálaya;* the *kokila* or *indian* cuckoo

කුදිකපනවා *v.* (කුදිය *and* කපනවා *to cut*) to hough, to hamstring

කුදිය *s.* the fetlock joint

කුද්දකනිකාය *s.* the last of the 5 divisions of *sútra pitaka,* comprizing 15 books

කුඩුවැව *s.* (කුඩු *small* වැව *a lake*) a tank, a pond

කුමරුවා *s.* a child, an infant

කුමාල see කුමාර

කුමුදවතී see කුඹුවතී

කුමුදුවනවා *v.* to rince the mouth

කුමුදුතිය see කුඹුවතී

කුඹුරුවැල් *s.* a sort of trumpet flower (*bignonia suave-olens*)

කුරල් *s.* an ear of corn

කුරහන් see කුරක්කන්

කුරහන්තලප *s.* pap or porridge made of *natchee*

කුරුළු *s.* a tortoise

කුරුවිට *a.* round, globular

කුලමල *s.* depreciation

කුලවමි *s.* (කුල *and* වමි *a woman*) a chaste woman

කුලාව *s.* a vessel, a jug

කුළු see කුල

කුළුගන්වනවා *v.* (කුළු *top, summit* ගන්වනවා causal of ගන්නවා *to take*) to place or set on the summit, literally or metaphorically

කුළුපස *s.* (කුළු *a spice* පස *five*) a compound of five spices, or ginger, pepper, *tippili,* cinnamon, and cardamums

කුළුවර *s.* a worker in straw, ratans &c.

කුවින්නා *s.* a weaver

කුසබෑණා *s.* a uterine brother

කුසලාන *s.* a cup, a drinking vessel

කුසිනාරා *s.* a city, in the district of *mallawa,* celebrated among the *buddhists* as the death place of their founder *gautama*

කුසීද *s.* laziness; usury

කුසුම්සැර see කුසුම්දුනු

කුසූල *s.* (කුස *to enfold* ඌල *aff.*) a granary, a cupboard, a place or vessel in which grain is kept

කුස්සෙය *s.* a lotus in general

කුස්දර *s.* a man living at another's expense

කුසමාඩ see කුෂ්මාඩ

කූප්පර *s.* the elbow

කූබර or කූවර *s.* the pole of a carriage or wood to which the yoke is fixed

කූවරි *s.* a carriage covered with cloth

කූර්මෝදර *s.* (කූර්ම *a tortoise* උදර *the belly*) a disease, an induration of the mesenteric glands?

කූෂ්මාඩ see කුෂ්මාඩ

කෙඩය *s.* a vase or ewer

කෙණ *s.* a moment

කෙණෙර *s.* a female elephant

කෙම්මර *s.* *capuism,* the worship of the gods, demons &c.

කෙම්මරදවස *s.* (කෙම්මර *and* දවස *a day*) the day of worshipping the gods or demons

කෙඩිය see කෝතාය

කෙරෙහි *ind.* a particle and affix, used for the dative and locative, to, towards &c.

කෙලිල්ල *s.* the knee

කොලසැදර see කෙලෙස

කෙලෙස්නිවෙස් *s.* (කෙලෙස් *kailása* නිවෙස් *residence*) *siva*

කොමින්නා *s.* the part of a ring where the stone is set

කොසැකිලි *s.* (කොස *urine* කිලිය *a house*) a privy

කෝසකේස *s.* (කේස *hair* වෙස

*ornament*) a tress or fillet of hair

කොපුඹු *s.* the handle of a box or trunk

කොන්ත see කිරාතතික්ත appendix

යොකදෙනවා *v.* to hallo or shout, to huzza

කොක්නාපක්ෂියා *s.* (කොක්ක *a fork* නා *the bill* පක්ෂි *bird*) a bird (*turdus gingianus*)

කොක්නාමුව *s.* (කොක්නා *and* මුව *a deer*) a wolf

කොටදිඹුල *s.* a tree (*ficus oppositifolia*)

කොටම්ම *s.* a plant (*cóstus speciosus*)

කොට්ටර *s.* a clog of wood

කොට්ටෝරුවා *s.* a bird, a sort of woodpecker

කොඩපිලිකාව *s.* (කොඩ *and* පිලිකාව *a wen*) a wen on the back or shoulder

කොටොළු see කුඩල

කොතු *s.* laughter

කොඬා see කුම්මාඩ

කොපු *s.* a well

